# වාර්ෂික වාර්තාව 2016

LAKE HOUSE

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම

# පටුන


දැක්ම, මෙහෙවර හා ඇගයුම් 1

විශේෂිත වූ මූල්‍ය දත්තයන් 3

සභාපතිතුමාගේ සමාලෝචනය 4

මූල්‍ය සමාලෝචනය 7

අවදානම් කළමනාකරණය 8

ආයතනික පාලනය 9

අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව 12

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 14

විගණකාධිපතිතුමාගේ වාර්තාව 15

විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් සභාපතිතුමාගේ නිර්දේශ 25

මානව සම්පත් 32

විස්තරාත්මක ආදායම් ප්‍රකාශය 33

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 34

අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය 35

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය 36

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් 37

එකතුකළ වටිනාකම් ප්‍රකාශය 61

දස අවුරුදු සාරාංශය 62

කොටස් පිළිබඳ තොරතුරු 63

ආයතනික තොරතුරු 64

## දැක්ම

ශ්‍රී ලංකාවේ විශ්වාසනීය සහ නව්‍යකරණ මාධ්‍ය සේවා සැපයුම්කරු බවට පත්වීම

## මෙහෙවර

ප්‍රධානතම පෙර ගමන්කරු බවට පත්වෙමින් රටේ විශ්වාසනීය හා උසස් තත්ත්වයේ මාධ්‍ය නිෂ්පාදන/සේවා සැපයීමේ ප්‍රමුඛයා ලෙස පිළිගැනෙන තත්වයට අප පුරෝගාමී මුද්‍රිත මාධ්‍ය ආයතනය බවට පරිවර්තනය වීම. මෙහෙයුම් විශිෂ්ටත්වය, නිෂ්පාදන අගයන් ඉහළ නැංවීම මඟින් සහ පෘථුල ප්‍රවෘත්ති එක්රැස් කිරීම කාර්යක්ෂමව භාවිත කරමින් හා අති නවීන තාක්ෂණය හා බැඳි යටිතල පහසුකම් වර්ධනය කිරීම මගින් අපි මෙම ඉලක්කය සපුරා ගන්නෙමු. අපගේ සෑම ක්‍රියාවකදීම ජාතික වැදගත්කම ප්‍රමුඛ කොට තබා ගනිමින් පැහැදිලිව නිර්ණය කළ උපාය මාර්ග අප වෙළෙඳපොළ නායකත්වය උසස් කරලීමටත්, ලාභදායිත්වය හා වර්ධනය, තිරසාරව පවත්වා ගැනීමටත් අපි නිබඳවම කටයුතු කරන්නෙමු.

## ඇගයුම්

- අපි ජාතික අභිමතය ප්‍රමුඛ ස්ථානයෙහි තබා කටයුතු කරන්නෙමු.
- අපි අපගේ පාරිභෝගිකයන්ගේ ජීවිතය සුපෝෂණය කරන්නෙමු.
- අපි එක කණ්ඩායමක් වශයෙන් කටයුතු කරන්නෙමු.

# විශේෂිත වූ මූල්‍ය දත්තයන්

| මූල්‍ය ක්‍රියාකාරකම්වල විශේෂිත වූ මූල්‍ය දත්තයන් | | 2016 | 2015 නැවත ප්‍රකාශය | වෙනස | වෙනස % |
|---|---|---|---|---|---|
| පිරිවැටුම | රු. '000 | 3,050,156 | 2,954,438 | 95,718 | 3% |
| ස්වෙච්ඡාවෙන් විශ්‍රාමයාම, බදු හා සාධාරණ අගය ගැලපීමට පෙර ලාභය | රු. '000 | 192,521 | 16,204 | 176,317 | 1088% |
| ස්වෙච්ඡාවෙන් විශ්‍රාමයෑමේ වියදම | රු. '000 | 163,513 | - | - | - |
| බදු හා සාධාරණ අගය ගැලපීමට පෙර ලාභය | රු. '000 | 29,008 | 16,204 | 12,804 | 79% |
| බදු හා සාධාරණ අගය ගැලපීමෙන් පසු ලාභය | රු. '000 | 20,608 | 39,938 | (19,330) | -48% |
| සේවකයෙකුට පිරිවැටුම | රු. '000 | 2,005 | 1,695 | 310 | 18% |
| බදු හා සාධාරණ අගය ගැලපීමට පෙර ලාභය සේවකයින් සඳහා | රු. '000 | 19 | 9 | 10 | 111% |
| ජාතික ආර්ථිකයට දායකත්වය | රු. '000 | 399 | 415 | (16) | -4% |
| ආයෝජන ආදායම | රු. '000 | 13,744 | 14,414 | (670) | -5% |
| මූල්‍ය වියදම | රු. '000 | 49,938 | 58,502 | (8,564) | -15% |
| කොටසක ඉපයීම | රු. | 6 | 11 | (5) | -45% |
| යෙදූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ | | 4% | 8% | -4% | -50% |

| ශේෂ පත්‍රයට අදාළ විශේෂිත වූ මූල්‍ය දත්තයන් හා අනුපාත (ශේෂ පත්‍ර දිනට) | | | | | |
|---|---|---|---|---|---|
| මුළු වත්කම් | රු. '000 | 1,920,908 | 1,698,861 | 222,047 | 13% |
| දේපළ පිරියත හා උපකරණ | රු. '000 | 358,159 | 252,535 | 105,624 | 42% |
| දිගුකාලීන මූල්‍ය වත්කම් | රු. '000 | 180,056 | 179,941 | 115 | 0% |
| කොටස් හිමියන්ගේ අරමුදල් | රු. '000 | 542,388 | 517,284 | 25,104 | 5% |
| නිකුත්කළ කොටස් ප්‍රමාණය | '000 | 3,484 | 3,484 | - | 0% |
| කොටසක ශුද්ධ වත්කම් | රු. | 156 | 148 | 8 | 5% |
| ජංගම අනුපාතය | වාර ගණන | 2.1 | 2.0 | 0 | 5% |
| ක්ෂණික අනුපාතය | වාර ගණන | 1.6 | 1.6 | 0 | 0% |

# සභාපතිතුමාගේ සමාලෝචනය

***හිතවත් කොටස්කරුවනි,***

2016 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන සමාගමේ වාර්ෂික වාර්තාව සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඔබ වෙත ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි.

## සාර්ව ආර්ථික පරිසරය

අවිනිශ්චිත වූ දිගුකාලීන කාලපරිච්ඡේදයන් මධ්‍යයේ ජාතික ආණ්ඩුව යොදා ගන්නා ලද නිවැරදි ක්‍රියාමාර්ග හේතු කොටගෙන 2016 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්ථාවර විමේ ලක්ෂණ පෙන්වන ලදී.

අවාසිදායක කාලගුණික තත්ත්වයන් සහ මන්දගාමී වූ ගෝලීය ආර්ථිකය 2016 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන වේගය මූර්ත වශයෙන් 4.4% ක් ලෙස සටහන් වීමට හේතු වූ අතර මෙම අගය 2015 වර්ෂයේදී ළඟා කරගත් 4.8% ක වර්ධන වේගයට වඩා මන්දගාමී අගයකි. කෙසේ වුවත් දැඩි මූල්‍ය සහ ෆිස්කල් ප්‍රතිපත්ති මධ්‍යයේ දෙවන කාර්තුවේ සිට කාර්තුමය වර්ධන වේගයෙහි ස්ථිර වැඩි වීමක් දක්වන ලදී. ඉදිකිරීම් අංශයේ ආයෝජන වියදම් වල වැඩි වීම 2016 වසරේ වර්ධනයට තුඩුදුන් අතර ආර්ථික ප්‍රතිපත්ති වාතාවරණය හමුවේ පරිභෝජන වියදම්වල පහත වැටීමක් සිදු විය.

2016 වර්ෂයේ පළමු මාස 4 තුළ අවම ව පැවති උද්ධමනය ඉන් පසුව වාර්ෂික මධ්‍ය අගය 4% ක් දක්වා වැඩිවීමක් වාර්තා විය. අහිතකර ලෙස බලපැවැත්වූ කාලගුණික බාධාවන් සහ වැඩි වෙමින් පැවති ගෝලීය වෙළඳ භාණ්ඩ මිලගණන් 2016 වර්ෂයේ ඇතැම් මාස තුළ පැවති තීව්‍ර උද්ධමනයට දැඩි ලෙස බලපාන ලදී. සමාගමේ ඉල්ලුම වැඩි වීමට මූලික උද්ධමනය ඉහළ මට්ටමක පැවතීම හේතු පාදක විය.

## සමාගමේ ක්‍රියාකාරීත්වය

ආයතනය විසින් රුපියල් බිලියන 3 ක ආදායමක් වාර්තා කරන ලද අතර ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමයට අදාළ පිරිවැය, බදු සහ සාධාරණ මිල ගැලපීමෙන් පසු ලාභය රුපියල් මිලියන 20.6 ක් ලෙස වාර්තා විය. මුද්‍රිත ඉලෙක්ට්‍රොනික හා සමාජ මාධ්‍ය අතර පවත්නා දැඩි තරඟකාරිත්වය හමුවේ ලේක්හවුස් කණ්ඩායම ළඟාකරගත් මෙම ප්‍රගතිය විශිෂ්ට වේ. 2016 වර්ෂයේ ඔක්තෝබර් මස 05 සහ නොවැම්බර් මස 22 යන දිනයන්හි ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රම 2 ක් ප්‍රකාශයට පත් කරන ලදී. ඒ අනුව සේවකයන් 177 දෙනෙක් ඉල්ලා අස්වූ අතර, ඒ සඳහා දරන ලද පිරිවැය රුපියල් මිලියන 163.5 ක් විය. මෙම ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමයෙහි ප්‍රතිලාභ මගින් ඇතිවන සේවක පිරිවැය අවම වීමේ වාසිය ඉදිරි වර්ෂ කිහිපය තුළදී ආයතනයේ ක්‍රියාකාරිත්වයට වාසි දායක බලපෑමක් ඇති කරනු ඇත.

අපගේ ප්‍රධාන අමුද්‍රව්‍ය වන පත්‍ර කඩදාසි, මුද්‍රණ තැටි සහ යන්ත්‍රසූත්‍රවලට අදාළ අමතර කොටස් වෙනුවෙන් අධික ලෙස ආයතන මත රඳා පැවැතීමට සිදුවිය. ගෝලීය මිල නැඹුරුතාවයන් සහ මිල උච්ඡාවචනයන් හමුවේ අපගේ තත්ත්වය දිගින් දිගටම අවදානම් සහිත වේ. අපගේ ප්‍රකාශන සඳහා වැඩිවන ඉල්ලුම සම්පූර්ණ කරමින් මුද්‍රණ යන්ත්‍ර සහ යෙදවුම් මට්ටම ප්‍රශස්ත තත්ත්වයේ පවත්වා ගැනීම සඳහා ආයතනය තවදුරටත් යන්ත්‍රසූත්‍ර වැඩිදියුණු කිරීම්වලට යොමුවන ලදී. සමාලෝචිත වර්ෂයේදී අපගේ මැග්නම් මුද්‍රණ යන්ත්‍රයේ ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීම සඳහා ආයතනය විසින් රුපියල් මිලියන 137 ක් ආයෝජනය කරන ලදී.

## කොටස්කරුවන් සඳහා ප්‍රතිලාභ

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොටසක් වෙනුවෙන් රුපියල් 1.00 බැගින් රුපියල් මිලියන 3.4 ක් ලාභාංශ ලෙස ගෙවීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් යෝජනා කරන ලදී.

## ආයතනික සමාජීය වගකීම

ප්‍රමුඛ පෙළේ මුද්‍රිත මාධ්‍ය ආයතනයක් ලෙස මහජන අපේක්ෂාවන් පිළිබඳ අප මනාව සැලකිලිමත් වන අතර ශ්‍රී ලාංකීය අගනාකම් සහ සම්ප්‍රදායන්ට අනුකූල වූ ආගමික, ජාතික සහ සංස්කෘතික ප්‍රමුදිතභාවය උදෙසා සහාය දීමට අප දැඩිව කැප වී සිටිමු. ආයතනය විසින් ප්‍රමුඛත්වය දී කටයුතු කළ එවැනි ක්‍රියාකාරකම් පහතින් සඳහන් වේ.

- ඩී. ආර්. විජේවර්ධන ගුණානුස්මරණ දේශනය
- වෙසක් අමාදහර
- මිහින්තලා ආලෝක පූජාව
- ඔබ්සර්වර් මොබිටෙල් වසරේ හොඳම පාසැල් ක්‍රිකට් ක්‍රීඩකයා සම්මාන උළෙල
- සරසවිය සම්මාන උළෙල
- සෙනෙහෙ සියපත ආපදා සහන වැඩසටහන

## අනාගත දර්ශනය

ආයතනයේ අනාගතය වෙනුවෙන් අප සර්වශුභවාදීව කටයුතු කරන්නෙමු. 2016 වර්ෂය සාර්ථක ලෙස නිම කිරීමත් සමගම අපගේ අභිප්‍රාය අනාගතය උදෙසා අඛණ්ඩ වර්ධනය සහ නවෝත්පාදනය ඉදිරියට පවත්වා ගෙන යාමය. මධ්‍ය හා දිගුකාලයේදී විවිධ වෙළඳපළ සඳහා ගුණාත්මක සහ විශ්වාසනීය පුවත්පත් සපයමින් අපගේ වෙළඳපළ කොටස තවදුරටත් පුළුල් කිරීම සඳහා ආයතනයේ ඉදිරි කටයුතු පවත්වාගෙන යනු ලබයි. එසේම මුද්‍රණ පිරිවැය ප්‍රශස්ථ මට්ටමෙන් පවත්වාගෙන යාමට සහ ගුණත්වය සහ තරඟකාරී මිලකරණ අවශ්‍යතා හමුවේ නව ජාත්‍යන්තර අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් ගවේශණය කිරීම සඳහා ඉදිරියේදී පිරිවැය කළමනාකරණ උපායමාර්ග ක්‍රියාවට නංවනු ලැබේ.

තවදුරටත් තරඟකාරී වීම සඳහා අදාළ අන්තර්ගතය සහ සැලසුම් වෙනුවෙන් ආයෝජනය කරමින් අප පුවත්පත්වල වටිනාකම වැඩිදියුණු කිරීමේ වැඩපිළිවෙලක් දැනටමත් සැලසුම් කර ඇත. ආයතනයේ පුළුල් වර්ධනය සඳහා වන මාවත බාධා රහිත කිරීම සඳහා ස්ථාවර ආර්ථික ප්‍රතිපත්ති මගින් ආර්ථිකය පෙළඹවීමට පවත්නා දේශපාලන සහ ආර්ථික තත්ත්වයන් ස්ථිර ලෙස පැවැත්වෙන බව අපගේ විශ්වාසයයි.

# සභාපතිතුමාගේ සමාලෝචනය



# සභාපතිතුමාගේ සමාලෝචනය

## ස්තූතිය

2017 ජූලි මස 18 වන දින ලේක්හවුස් ආයතනයේ සභාපති ලෙස පත්වූ මා මාගේ පුරෝගාමී කාවන් රත්නායක මහතාට වසර 2 1/2 ක් වූ ඔහුගේ නිල කාලය තුළ ලේක්හවුස් ආයතනය උසස් ජයග්‍රහණයන් කරා මෙහෙයවීමට දැක්වූ මගවෙන්වීම සහ නායකත්වය වෙනුවෙන් ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ආයතනය වෙනුවෙන් දායකත්වය දුන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම සාමාජිකයන් හට ස්තූති වන්ත වන අතර, ඔවුන් සමග කටයුතු කිරීමට අපේක්ෂා කොටගෙන සිටිමි. ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් ආයතනයේ විධායක කමිටුවට සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන්ට, අපගේ ව්‍යාපාරික හවුල් කරුවන්ට සහ අපට ඉතා හිතවත් පාඨකයන් හට ඔවුන්ගේ සහයෝගය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමි.



**ක්‍රිශාන්ත කුරේ**
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ

# මූල්‍ය සමාලෝචනය

**මූල්‍ය වාර්තාකරණය හා කාර්ය සිද්ධි**

සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මූල්‍ය වාර්තාකරණය හා යාවත්කාලීන කිරීම සඳහා නවීනතම මූල්‍ය වාර්තා කිරීම් තෝරා ගන්නා ලදී. 33 වන පිටුවේ සිට මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම වරලත් ගණකාධිකාරී ආයතනයේ රෙගුලාසිවලට අනුකූලව සකස් කොට ඇත. එසේම සෑම අවස්ථාවකදීම ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දක්වන්නන්ට පැහැදිලි හා පුළුල් දැනුමක් ඇතිවන පරිදි මූල්‍ය වාර්තා සකස් කොට ඇත.

**මූල්‍ය ක්‍රියාකාරීත්වය**

**සමූහයේ මූල්‍ය ක්‍රියාකාරීත්ව සාරාංශය**

| අයිතමය | 2016 රු. මිලියන | 2015 රු. මිලියන නැවත ප්‍රකාශ කරන ලද | වෙනස රු. මිලියන | වෙනස % | ප්‍රධාන සාධකය |
|---|---|---|---|---|---|
| ආදායම | 3,050 | 2,954 | 96 | 3% | වෙළඳ දැන්වීම් ආදායම වැඩිවීම |
| විකුණුම් පිරිවැය | 1,412 | 1,385 | 27 | 2% | ඉහත කරුනු වලට අදාළව විකුණුම් පිරිවැය වැඩිවීම |
| වෙනත් ආදායම් | 122 | 124 | (2) | -2% | වෙනත් ආදායම් වල අඩුවීම |
| පරිපාලන වියදම් | 1,183 | 1,286 | (103) | -8% | වෙළඳාමට අදාළ වියදම් අඩුවීම |
| බෙදාහැරීමේ වියදම් | 334 | 333 | 1 | - | ප්‍රවාහන වියදම්වල වැඩිවීම |
| ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ වියදම | 164 | - | - | - | 2016 වර්ෂයේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ යෝජනා ක්‍රමය |
| මූල්‍ය වියදම් | 50 | 59 | (9) | -15% | ණය පොලිය අඩුවීම |
| බදු | 9 | 5 | 4 | 80% | ආදායම් බදු වැඩිවීම |
| සාධාරණ අගය ගැළපීම | - | 29 | - | - | - |
| බදු පසු ලාභය සහ සාධාරණ අගය ගැළපීම | 21 | 40 | (19) | - -48% | ඒකාබද්ධ ව්‍යාපාරයන්ගේ බදු පසු ලාභය අඩුවීම |

**ආයතන සමූහයේ ආදායම**

2016 වර්ෂයේදී ආයතන සමූහය රු. මිලියන 3,050 ක ආදායමක් වාර්තා කළ අතර, එය 2015 වර්ෂයේ වාර්තා කළ රු. මිලියන 2,954 ක ආදායම හා සසඳන විට 3% ක වර්ධනයකි.

**සමූහ ආදායම**




**ආදායම් මූලාශ්‍ර**

ආයතනයේ ප්‍රධානතම ආදායම් මූලාශ්‍රය වන දැන්වීම් ආදායම රු.මිලියන 459 ක වර්ධනයක් 2016 වර්ෂයේදී වාර්තා කරන ලද අතර, එය 22% ක වර්ධනයකි. එම වර්ධනය ලබාගෙන ඇත්තේ පුවත්පත් මාධ්‍ය ක්ෂේත්‍රයේ පැවති දැඩි තරගකාරීත්වය හමුවේදීය. පුවත්පත් අලෙවි ආදායම 2015 වර්ෂයට වඩා රු. මිලියන 95 කින් අඩු වූ අතර, එය 18% ක පහත වැටීමකි.

| ආදායම් මූලාශ්‍ර | 2016 රු. මිලියන | 2015 රු. මිලියන |
|---|---|---|
| දැන්වීම් | 2,547 | 2,088 |
| පුවත්පත් අලෙවි ආදායම | 440 | 535 |
| වෙළඳ මුද්‍රණ ආදායම | 51 | 313 |
| වෙනත් ආදායම් | 12 | 18 |
| **මුළු ආදායම** | **3,050** | **2,954** |

# අවදානම් තත්ත්ව කළමනාකරණය

ආයතනයේ බිඳ වැටීම හා අවදානම් සමලෝචනය නිසියාකාරව සමබර කර ඇති බව තහවුරු කෙරෙන ප්‍රබල අවදානම් කළමනාකරණයක් මගින් තිරසාර වර්ධනයට ආධාරක සපයා ඇත. සමාගම තුළ, අවදානම් කළමණාකරණ අභිවර්ධනය, සියලුම පුද්ගලයින් හා දෙපාර්තමේන්තු තුළ පැතිරී යාමට සලස්වමින් උපාය මාර්ග දැක්වීමේදී මෙන්ම එදිනෙදා කටයුතු පවත්වා ගෙන යෑමේදීද අවදානම් කළමනාකරණ සංස්කෘතියක් සාර්ථකව නිර්මාණය කර ඇති හෙයින්, අවදානම් සමාලෝචනය ප්‍රබල ආදායමක් ගොඩ නගයි.

### ණය අවදානම

සමාගමේ ගනුදෙනුකරුවන්ගෙන් කිසිවකු හෝ සමාගම හා බැඳී ඇති ගිවිසුම් පිළිබඳ තම පොරොන්දු ඉෂ්ට කිරීමට අපොහොසත් වුවහොත් ඇතිවන මූල්‍යමය පාඩු ලෙස ණය අවදානම් අර්ථ ගැන්වේ.

සමාගමේ ණය අවදානම් කළමනාකරණ රාමුවෙහි ප්‍රධාන පාර්ශ්වයන් මෙසේය.

- පළපුරුදු හා සුදුසුකම්ලත් මාණ්ඩලිකයින් විසින් නිසි ඇගැයීමකින් පසුව ණය අනුමැතිය දෙනු ලැබේ.
- ණය ක්‍රියාමාර්ග අනුගමනය කර ඇති අතර, සැක සහිත ණය සඳහා ප්‍රමාණවත් විධිවිධාන සලස්වා ඇත.

### මෙහෙයුම් අවදානම

ප්‍රමාණවත් නොවන හෝ අසාර්ථක අභ්‍යන්තරික ක්‍රියාමාර්ග. ජනතාව සහ පද්ධතීන් හෝ බාහිර සිද්ධීන් මගින් ඇතිවන සෘජු හෝ වක්‍ර පාඩුව ලෙස මෙහෙයුම් අවදානම නිර්නය කෙරේ.

සමාගමේ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවෙහි ප්‍රධාන පාර්ශ්වයන් මෙසේය.

- පද්ධති හා ක්‍රියාමාර්ග බිඳ වැටීමකදී මෙහෙයුම් කටයුතු සඳහා බාධාවීම් අවම කිරීමට ව්‍යාපාර සම්බන්ධතා සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- රාජකාරී වෙන් කොට තැබීම සහතික කරනු ලබන මනාව නිර්නය කළ රැකියාවේ වගකීම් පැහැදිලි කිරීම.
- අභ්‍යන්තර පාලක පද්ධතීන් හි අසාර්ථකත්වයන් හඳුනා ගැනීමට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කිරීම් කර ගෙන යනු ලැබේ.

සමාලෝචනයට ලක්වන වසර තුළ මෙහෙයුම් අවදානම තුළින් සැලකිය යුතු තරම් පාඩු සිදු නොවීය.

### උපාය මාර්ගීය අවදානම

උපාය මාර්ගික අවදානම් යනු සමාගමේ අනාගත ව්‍යාපාර සැලසුම් සහ උපාය මාර්ග ප්‍රමාණවත් නොවීමට ඇති හැකියාව නිසා ඇති වන අලාභයන්ය.

සමාගමේ උපාය මාර්ගික අවදානම් කළමනාකරණ රාමුවෙහි ප්‍රධාන පාර්ශ්වයන් මෙසේය.

- කර්මාන්ත නැමියාව, හවුල්කරුවන්ගේ අවශ්‍යතා සහ අපගේ අගය නිර්මාණය කිරීමේ ශක්තීන් හා දුවර්ලතා පිළිබඳ අධිකාරිත්වය ගනු ලබන, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබූ ආයතනික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
- පූර්ව අධිෂ්ඨාන සහිත ක්‍රියාකාරිත්ව දර්ශකයන්ට එරෙහිව ආයතනික සැලැස්මේ ක්‍රියාකාරිත්වය ස්ථිර පදනමක් මත සමාලෝචනය කිරීම.
- වෙළඳපළ ක්‍රියාශීලීත්වය, සාර්ව ආර්ථික වෙනස්කම් සහ තරගකාරී හැසිරීම ඇතුළු කර්මාන්ත නැඹුරුව අධීක්ෂණය කිරීම නොනැවතී කරගෙන යාම.

### අනුකූලතා අවදානම

මූල්‍ය අලාභයන් හෝ සමාගමේ කීර්තියට හානි වීම් අවම කෙරෙන යෝග්‍ය නීති රෙගුලාසි, චර්යා සංග්‍රහ සහ යහපත් ව්‍යවහාරයන්හි ප්‍රමිතීන් හා සමඟ එකඟ නොවීමෙන් ඇතිවන අවදානම අනුකූලතා අවදානම වේ.

### තොරතුරු තාක්‍ෂණ අවදානම

තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ වන අවදානම්, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමය තුළ තක්සේරු කෙරේ.

සමාගමේ පරිගණක අවදානම් කළමනාකරණ රාමුවේ ප්‍රධාන පාර්ශ්වයන් මෙසේය.

- බලපත්‍ර සහිත මෘදුකාංග භාවිතය
- පරිගණක වෛරස් මර්දන මෘදුකාංග භාවිතය
- අන්තර්ජාල භාවිතය සියුම් ලෙස අධීක්ෂණය කිරීම
- ෆයර්වෝල් මෘදුකාංග භාවිතය
- පණිවිඩ යැවීමේ සේවා මෙහෙයුම්

# ආයතනික පාලනය

හවුල්කාර අගය නිර්මාණයෙහි සහ දිගුකාලීන තිරසාර පැවැත්මෙහි මුල්ගල ශක්තිමත් ආයතනික පාලනයයි. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම, එහි පෘථුල ප්‍රතිපත්ති රාමු තුළ ප්‍රත්‍යක්ෂ කොට ඇති පරිදි සහ යෝග්‍ය බල තුලනයකට පහසුකම් සලසාලන පැහැදිලි පාලන ව්‍යුහයන් තුළ ව්‍යාපාරික සාර ධර්ම, වගවීම් සහ විනිවිද බව උසස් ප්‍රමිතීන් කෙරෙහි කැපවී සිටී. සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි ආයතනික පාලන රාමුව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අවශ්‍යතාවයන් හා සමඟ සමගාමීව පවතිනු පිණිස සැලසුම් කොට ඇත.

## 1. අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලය, තම වගකීම් ඵලදායි ලෙස ඉටුකිරීමට ශක්තිය ලබාදෙන නිපුණතා, පළපුරුද්ද, ස්වාධීනත්වය සහ දැනුම අදාළ සම්බරතාවයෙන් හෙබි අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විතය. අඩුතරමින් මසකට දෙවරක්වත් රැස්වෙන අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමට වැදගත් වන කරුණු පිළිබඳ තීරණ ගැනීමේ ප්‍රධාන මණ්ඩලය වේ.

| | අධ්‍යක්ෂවරයාගේ නම | පැවැත්වූ රැස්වීම් සංඛ්‍යාව | සහභාගිවූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1. | කාවන් රත්නායක මහතා - සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂ | 18 | 18 |
| 2. | සමන් වගආරච්චි මහතා | 18 | 17 |
| 3. | ආචාර්ය එමෙරික් මැන්ලි ප්‍රනාන්දු මහතා | 18 | 17 |
| 4. | ලක්ෂ්මන් හේවාපන්න මහතා | 18 | 18 |
| 5. | සිරිමෙවන් ඩයස් පියසේන මහතා | 18 | 14 |

## 2. අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හා ඒවායේ සංයෝගය

මණ්ඩලය, පහත සඳහන් කමිටු පිහිටුවා ඇත.

### 2.1 විධායක කමිටුව ("එක්ස්කෝ" - EX-CO)

අධ්‍යක්ෂ මණ්ඩලයට කාර්යක්ෂමව සිය වගකීම් ඉටුකිරීමට හැකි වනසේ අදාළ හා කාලෝචිත තොරතුරු මණ්ඩලය වෙත ලබාදීම විධායක කමිටුවේ වගකීම වේ. විධායක කමිටුවේ සාමාජිකයින් පහත දැක්වේ.

- සාමාන්‍යාධිකාරී
- සමාගමේ ලේකම්
- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුද්‍රණ හා නඩත්තු
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව ප්‍රාග්ධන
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - දැන්වීම්
- ප්‍රධාන පරිපාලන නිලධාරී

### 2.2 විගණන කමිටුව

අඛණ්ඩව කාර්තුවකට වතාවක් රැස්වෙන විගණන කමිටුව සමාගම සතුව ස්ථිර මූල්‍ය විනයක් පවතින බව තහවුරු කිරීමට අභ්‍යන්තර පාලනය කටයුතුවල ප්‍රබලත්වය සමාලෝචනය කොට අධීක්ෂණය කරනු ලබයි. විගණන කමිටුව, අභ්‍යන්තර විගණනයෙහි වාර්ෂික විගණන ක්‍රියාකාරී සැලැස්ම කලින්ම අනුමත කොට එහි සම්පාදනය හා ප්‍රගතිය අධීක්ෂණය කරයි. විගණන කමිටු සාමාජිකයින් මෙසේය.

- සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ
- අධ්‍යක්ෂ - මුදල්
- අධ්‍යක්ෂ - නීති
- අධ්‍යක්ෂ - මෙහෙයුම්
- සාමාන්‍යාධිකාරී
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
- ජනමාධ්‍ය හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ නියෝජිතයෙකු

# ආයතනික පාලනය

### 2.3 ප්‍රසම්පාදන කමිටුව

ප්‍රසම්පාදන කමිටුව (ශ්‍රී ලංකා රුපියල් දශලක්ෂයකට වඩා වැඩි) ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුරූපීව හා නිවැරැදිව යොදා ගන්නා බව සහතික කරලීමට ස්ථාපනය කොට ඇත. ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් මෙසේය.

- සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ
- අධ්‍යක්ෂ - මුදල්
- අධ්‍යක්ෂ - නීති
- සාමාන්‍යාධිකාරී
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - පරිපාලන
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මුදල්
- ප්‍රධාන අභ්‍යන්තර විගණක
- ප්‍රසම්පාදන දෙපාර්තමේන්තු ප්‍රධානී

### 2.4 දුක් ගැනවිලි කමිටුව

සේවක මහත්ම මහත්මීන්ගේ දුක් ගැනවිලි සඳහා පිළියම් සළකා බැලීමට දුක්ගැනවිලි කමිටුව ස්ථාපනය කොට ඇත. මෙම වසර තුළ දුක් ගැනවිලි 72 ක් විමර්ශනයට ලක්කොට ඉන් 37 ක් විසඳා ඇත. දුක් ගැනවිලි කමිටු සාමාජිකයින් මෙසේය.

- අධ්‍යක්ෂ - නීති
- අධ්‍යක්ෂ - මෙහෙයුම්
- සාමාන්‍යාධිකාරී
- නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව ප්‍රාග්ධන

## 3. මූල්‍ය වාර්තාකරණය සහ පාරදෘශ්‍ය බව

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම් ප්‍රතිපත්ති, සංකල්ප සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් පනවා ඇති ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සකස් කොට ඇත. මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති විසින් විගණනය කොට ඇත. එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම මූල්‍ය වාර්තාකරණයෙහි ලා හොඳම ක්‍රියා මාර්ග යොදා ගනිමින්, මූල්‍ය වාර්තාකරණය පරිසරයෙහි නව ප්‍රවණතා පිළිබඳව යාවත්කාලීනව සිටී. අංක 37 - 60 පිටුවල සඳහන් මූල්‍ය ප්‍රකාශන, සුළු හා මධ්‍යම ව්‍යවසායයන් (SMF) සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කළ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කොට ඇත.

## 4. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමෙහිලා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙහිලා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ නිවේදනය මෙම වාර්ෂික වාර්තාවේ 14 වන පිටුවේ සඳහන් කොට ඇත.

## 5. අභ්‍යන්තර පාලන විධි

අභ්‍යන්තර පාලන විධි පද්ධතීන් සැලසුම් කොට ඇත්තේ, සමාගමේ වත්කම් රැකගැනීමේදී වැරදි අත්හැරීම් හා අත් වැරදි මගින් ඇතිවන අවදානම් වලින් ආරක්ෂා වීමට සහ රාජකාරී වෙන්කොට දීම, අධිකාරී මට්ටමේ සහ අභ්‍යන්තර සහ බාහිර විගණන ක්‍රියාමාර්ග මගින් සුදුසු වැඩපිළිවෙලක් හරහා නිසි පොත් කට්ටලයක් වාර්තා කොට පවත්වාගෙන යාම පිණිසය. සමාගමේ ප්‍රමාණවත් හා කාර්ය සාධක අභ්‍යන්තර පාලනයන් ස්ථාන ගතකොට ඇති බව තහවුරු කරලීම මණ්ඩලයේ වගකීම වේ. එදිනෙදා මූල්‍යමය හා මූල්‍යමය නොවන ක්‍රියාකාරකම් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව මගින් නිතිපතා සමාලෝචනය කෙරේ.

## 6. ව්‍යවස්ථාපිත ගෙවීම් හා එකඟතාව

හඳුනාගත් සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් මේ දක්වා ගෙවා ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරන අතර, සේවකයින් වෙනුවෙන් ගෙවිය යුතු සියලු දායක මුදල් ගෙවා ඇත. නැතහොත් මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා ප්‍රතිපාදන සලසා ඇත.

## 7. කොටස්කරුවන් සමඟ සම්බන්ධතාවය

අපි, අපගේ කොටස්කරුවන් හා සමඟ නිතිපතා සම්බන්ධකම් හා සංනිවේදන කටයුතු පවත්වාගෙන යන්නෙමු.

## 8. ආයතනික සමාජ වගකීම

ප්‍රජාව හා සමාජය කෙරෙහි තම සවිස්තර වගකීම් සමාගම විසින් මනාව අවබෝධ කර ගෙන සිටී.

## 9. සේවක කරුණු සහ අදහස් හුවමාරුව

සේවකයින්ට තම මහත් ඕනෑකම් පාලනාධිකාරය වෙත පවසා ඔවුන්ගේ දුක් ගැනවිලි ඒ ඒ තැන්හිදීම විසඳා ගැනීමට කළමනාකාරිත්වය වෙත අසීමිත ප්‍රවේශ අවස්ථා ලබා දී ඇත.

**10. පාරිසරික සුරක්ෂණය**

පරිසරයට හානිදායක කිසිදු ක්‍රියාකාරකමකට සමාගම සම්බන්ධ වී නැත.

**11. අඛණ්ඩ පැවැත්ම**

අධ්‍යක්ෂවරු, අවශ්‍ය විමර්ශන සිදු කිරීමෙන් සහ ලබන වසර සඳහා සමාගමේ අයවැය ප්‍රාග්ධන වියදම් අවශ්‍යතා, අනාගත අපේක්ෂාවන්, අවදානම් මුදල් ප්‍රවාහය සහ ණය ලබාගැනීමේ පහසුකම් පිළිබඳ නිරීක්ෂණ ඇතුළු කටයුතු සමාලෝචනය කිරීමෙන් පසු මතු දකින අනාගතය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් අඛණ්ඩව පවත්වා ගැනීමට සමාගමටත්, සමූහයටත් ප්‍රමාණවත් සම්පත් ඇති බවට සාධාරණ බලාපොරොත්තු තබා ඇත.

එම නිසා, මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සාර්ථක ව්‍යාපාර පදනම යොදාගෙන ඇත.

# අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව විගණනය කරන ලද ගිණුම් වාර්තා සහ එදිනට ශේෂ පත්‍රය අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි.

**1. සමාගමේ ක්‍රියාකාරකම්**

සමාගමේ ප්‍රමුඛතම ක්‍රියාකාරකම වනුයේ පුවත්පත් මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත්කිරීම හා පුවත්පත් සහ සඟරා බෙදාහැරීමත් ය. මේ සම්බන්ධයෙන් සුවිශේෂී වෙනස්කම් සමාලෝචිත වර්ෂය තුළදී සිදු නොවිනි.

**2. මූල්‍ය ප්‍රකාශනයන්**

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

**3. විගණකවරුන්ගේ වාර්තාව**

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකවරුන්ගේ වාර්තාව වාර්ෂික වාර්තාවේ පිටු අංක 15 දක්වා ඇත.

**4. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති**

මූල්‍ය වාර්තා සකස් කිරීමේදී වාර්ෂික වාර්තාවේ සඳහන් සුවිශේෂී වූ ගිණුම් ප්‍රතිපත්ති අනුගමනය කර ඇත.

**5. වාර්ෂික සමාලෝචනය**

මූල්‍ය වර්ෂයට අදාළව සමාගමේ ක්‍රියාවලි සමාලෝචනය සහ එහි ප්‍රතිඵලය සභාපතිතුමාගේ සමාලෝචනය හා මූල්‍ය සමාලෝචනය තුළ ඇතුළත් වේ.

**6. ආදායම**

වර්ෂ 2016 දෙසැම්බර් මස 31 දිනට අවසන් වන වර්ෂය සඳහා සමාගම ලැබූ ආදායම රුපියල් මිලියන 3,050 කි.

**7. ලාභ සහ බෙදාහැරීම් (රුපියල් මිලියන)**

| | 2016 | 2015 |
|---|---|---|
| ස්වේඡාවෙන් විශ්‍රාම යාමට පෙර ලාභය | 193 | 16 |
| ස්වේඡාවෙන් විශ්‍රාම යාමේ වියදම | 164 | - |
| සාධාරණ අගය ගැළපීම් වලට පෙර ලාභය / (අලාභය) | 29 | 16 |
| බදු | (9) | (5) |
| සාධාරණ අගය ගැලපීම | 0 | 29 |
| බදු අයකිරීමෙන් පසු ලාභ / (අලාභ) | 21 | 40 |
| ලාභාංශ | - | - |
| ඉදිරියට ගෙන ගිය | | |
| රඳවාගත් ලාභය | 21 | 40 |

**8. අයභාර සංචිත**

2016 දෙසැම්බර් මස 31 දිනට සමාගමේ අයභාර සංචිත රුපියල් මිලියන 508 කි.

**9. දේපළ පිරියත හා උපකරණ**

2016 වර්ෂය තුළ සමාගම දේපළ පිරියත හා උපකරණ යන ප්‍රාග්ධන වියදම් සඳහා සහ නොනිම් ප්‍රාග්ධනය වෙනුවෙන් රු. මිලියන 189 ක් ආයෝජනය කර ඇත. වර්ෂය තුළ දේපළ, පිරියත හා උපකරණ වල වෙනස්වීම සටහන් අංක 06 යටතේ ඉදිරිපත් කර ඇත.

**10. පරිත්‍යාග**

සමාගම සමාලෝචිත කාලය තුළ රු. මිලියන 1.1 ක මුදලක් පුණ්‍යායතන සඳහා පරිත්‍යාග කොට ඇත.

**11. කොටසක ශුද්ධ වත්කම**

කොටසක ශුද්ධ වත්කම රුපියල් 155.68

**12. කොටස් පිළිබඳ තොරතුරු**

ලාභාංශ හා කොටසක ශුද්ධ වත්කම් වල ඉපයීමට අදාළ තොරතුරු සුවිශේෂී මූල්‍ය දත්තයන් හා දස අවුරුදු සාරාංශයන් යටතේ ඉදිරිපත් කර ඇත. කොටස් බෙදී ගොස් ඇති ආකාරය කොටස් පිළිබඳ තොරතුරු වාර්තාවේ ඇතුළත් වේ.

**13. බහුතර කොටස් අයිතිය**

ශ්‍රී ලංකා ජනරජය නියෝජනය වන අයුරින් 87.5% ක කොටස් බහුතරයක් මහා භාරකාරතුමා සතුව පවතී.

**14. අධ්‍යක්‍ෂවරු**

2016 දෙසැම්බර් 31 දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ කොටස් හිමිකම පහත දැක්වේ.

| | කොටස් ප්‍රමාණය |
|---|---|
| කාවන් රත්නායක මහතා | - |
| සමන් වගආරච්චි මහතා | - |
| එමරික් මැන්ලි ප්‍රනාන්දු මහතා | - |
| සිරිමෙවන් ඩයස් පියසේන මහතා | 1 |
| ලක්‍ෂමන් හේවාපන්න මහතා | 1 |

**15. වර්ෂය තුළ ඉල්ලා අස්වීම් / නව පත් කිරීම්**

2016 වර්ෂය තුළ දී අධ්‍යක්ෂ මණ්ඩලයට අලුතින් පත්කිරීම් හා ඉවත්වීම් සිදුවී නොමැත.

**16. අධ්‍යක්‍ෂවරුන්ට දුන් ණය**

ආයතනය අධ්‍යක්‍ෂවරුන්ට ණය ලබාදී නොමැත.

**17. ගිවිසුම් සඳහා අධ්‍යක්‍ෂවරුන්ගේ බැඳීම**

2016 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්‍ෂවරු සෘජුව හෝ වක්‍රව ආයතනයේ ගිවිසුම් සඳහා අත්සන් කොට හෝ ඉදිරි කාලයට අදාළ ගිවිසුම් සඳහා හෝ බැඳී නැත.

**18. අධ්‍යක්‍ෂවරුන්ගේ දීමනා**

2016 වර්ෂයේදී අධ්‍යක්‍ෂවරුන්ගේ දීමනා සම්බන්ධව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 23 යටතේ සඳහන් වේ.

**19. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්**

2016 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ශේෂ පත්‍රය පිළියෙල කිරීමෙන් පසු ගිණුම් මගින් ගැළපුම් කිරීම සඳහා අවශ්‍යතාවයක් පැන නැගී නොමැත.

**20. ව්‍යවස්ථාපිත ගෙවීම්**

රජයට හා සේවකයින්ට ගෙවන ලද සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනට ගෙවා ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

**21. අඛණ්ඩ පැවැත්ම**

ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය තරම් ප්‍රතිපාදන ඇති බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. මේ හේතු නිසා මෙම ආයතනය මූල්‍යමය වාර්තා සැකසීමේදී “අඛණ්ඩ පැවැත්ම” පදනම අනුගමනය කරයි.

**22. පාරිසරික ආරක්ෂණය**

ආයතනය කිසිම අයුරකින් පරිසරය දූෂණය වන සහ පාරිසරික නීති පද්ධතියට අනුකූල නොවන කිසිම කටයුත්තකට සහභාගි නොවූ බවට අධ්‍යක්‍ෂ මණ්ඩලය ඔවුන්ගේ දැනුමේ හා විශ්වාසයේ හැටියට සෑහීමකට පත්වේ.

**23. විගණකවරු**

ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 (3) ඡේදය අනුව විගණකාධිපති විසින් වර්ෂයේ ගිණුම් විගණනය කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි



**කුමුදු එච්. ගුණවර්ධන ඉඹුලමුරේ**
සමාගමේ ලේකම්

# අධ්‍යක්‍ෂවරුන්ගේ වගකීම්

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ විස්තර පහත දක්වා ඇත. විගණන වාර්තාව මගින් මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ඔවුන්ගේ වගකීම පෙන්වා දී ඇත.

2007 අංක 07 දරන සමාගම් පනත අනුව අධ්‍යක්ෂවරුන් විසින් එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු අතර, එම ප්‍රකාශ ගිණුම් වර්ෂය අවසාන දිනට සමාගමේ තත්ත්වය සහ වර්ෂය තුළදී ලද ලාභය සත්‍ය හා සාධාරණ ලෙස පිළිබිඹු කළ යුතුය. මෙම ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධ්‍යක්ෂකවරුන් විසින් පහත සඳහන් කරුණු සහතික කළ යුතුය.

1. සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන නොවෙනස්ව අනුගමනය කර ඇති බවත්, යම් ප්‍රමාණාත්මක බැහැර වීමක් ඇතොත් ඒවා හෙළිදරව් කර විස්තර කර ඇති බව,

2. අදාළ ගිණුම් ප්‍රතිපත්ති සියල්ල අනුගමනය කර ඇති බව,

3. තක්සේරු කිරීම් හා ගැළපීම් සාධාරණ සහ තහවුරු කළ හැකි බව,

4. මූල්‍ය වාර්තා සමාගම් පනත සමග අනුකූල වන බව සනාථ කිරීමට සහ සමාගමේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නිරවද්‍යතාවයකින් හෙළිදරව් කිරීමට අවශ්‍ය ගිණුම් වාර්තා ආයතනය පවත්වාගෙන යන බව සහතික කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීමයි. එමෙන්ම සමාගමේ වත්කම් ආරක්ෂා කිරීමට සහ මනා අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රමාණවත් පියවර ගැනීමට අධ්‍යක්ෂවරු වගකිව යුතු අතර, එමගින් වත්කම් වල ආරක්ෂාව සහ වංචා හා වැරදි වැළැක්වීම සහ සොයාගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බවට සහතික විය හැක.

5. අධ්‍යක්ෂවරු මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ වගකිව යුතු අතර, විගණකවරුන්ට විගණන වාර්තාව සකස් කිරීමට අවශ්‍ය සියලුම පහසුකම් ලබාදීම, ඔවුන්ට අවශ්‍ය පරිදි පරීක්ෂා කිරීම් කටයුතු සැලසීම අධ්‍යක්ෂවරුන්ගෙන් සිදුවිය යුතුය.

මෙම වාර්තාවේ සඳහන් පරිදි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම ඔවුන් නොපිරිහෙලා ඉටුකර ඇති බව ඔවුන්ගේ අදහසයි.

ආයතනයේ විගණකවරුන් වන විගණකාධිපති තුමා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට ලබා දෙන ලද මූල්‍ය ප්‍රකාශන සමග ගිණුම්කරණ වාර්තා, අදාළ තොරතුරු කොටස් හිමියන්ගේ සහ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා පරීක්ෂා කර බලා ඔවුන්ගේ මතය මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති විගණන වාර්තාවේ ඉදිරිපත් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි



ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම,
**කුමුදු එච්. ගුණවර්ධන ඉඹුලමුරේ**
සමාගමේ ලේකම්.

# විගණකාධිපතිතුමාගේ වාර්තාව

සභාපති,
ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ්.

**ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ්හි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (සමාගම) හා එහි පරිපාලිතයන්හි 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනතේ 16 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සමාගමේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

# විගණකාධිපතිතුමාගේ වාර්තාව

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

#### (අ) තත්ත්වාගණනය කළ මතය - සමාගම

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි (සමාගම) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### (ආ) තත්ත්වාගණනය කළ මතය - සමූහය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇසෝසියේටඩ් නිව්ස්පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (සමාගම) හා එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ඒවායේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමාගමේ සම්පූර්ණ අයිතිය සතු පරිපාලිතයන් වන සීමාසහිත ලේක් හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, සීමාසහිත ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගම සහ සීමාසහිත ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන ලබාගෙන තිබුණි. පහත සඳහන් කරුණු මත පදනම්ව සමාලෝචිත වර්ෂයේ මෙම පරිපාලිතයන් විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ මතයන් මා විසින් ප්‍රකාශ කරන ලදී.

**ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම.**

(i) සමාලෝචිත වර්ෂයේ මුල් මාස හයට අදාලව මූලික සටහන්වල විධිමත් වාර්තා සහ උපකාරක ලේඛන නඩත්තු නොකිරීම හේතුවෙන් එම ගනුදෙනු පරීක්ෂා කිරීමට නොහැකි වුණි. තවද, එම කාලපරිච්ඡේදයටම අදාළව පොදු ලෙජර් ගිණුම් ද විධිමත්ව තුලනය කර නොතිබුණි.

(ii) කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර හි 17.19 වගන්තියෙන් නිර්දේශ කර ඇති පරිදි 2016 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.782,574 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපළ, පිරියත සහ උපකරණ ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය සමාලෝචනය කිරීමකින් තොරව අඛණ්ඩව භාවිතා කර තිබුණි.

(iii) 2016 මාර්තු සිට මෙහෙයුම් කටයුතු නවතා දමන ලද සඟරා මුද්‍රණය කිරීමෙන් ජනිත වූ රු.4,374,033 ක අලාභය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙන්ව හෙළිදරව් කර නොතිබුණි.

**ලේක්හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම**

(i) රු.136,648 ක වටිනාකමක පරිපාලන වියදම් සඳහා මූලික සටහන්වල විධිමත් වාර්තා, උපකාරක ලේඛන සහ ගෙවීම් වවුචර් නඩත්තු කර නොතිබීමෙන් එම ගනුදෙනු පරීක්ෂා කිරීමට නොහැකි වුණි.

(ii) එකතුව රු.661,649 ක් වූ මවු සමාගම වෙනුවෙන් දරන ලද නඩත්තු වියදම්, ජල බිල්, විදුලි බිල් සහ වැටුප් මව් සමාගමෙන් අයකර ගැනීමකින් තොරව සමාගමේ වියදම් ලෙස වාර්තාගත කර තිබුණි.

(iii) කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි වගන්ති 4.4 ප්‍රකාර එහි ස්වභාවය සලකා බැලීමකින් තොරව වාර්තා ගත දිනයෙන් පසු මාස දොළහක් ඇතුළත උපලබ්ධි කරගැනීමේ බලාපොරොත්තුවක් නොමැති මව් සමාගම වෙත ලබාදෙන ලද රු.3,500,000 ක් වූ ණය ප්‍රමාණයක් ජංගම වත්කම් ලෙස දක්වා තිබුණි.

**ඔබ්සර්වර් ජොබ්ස් (පුද්ගලික) සමාගම**

(i) 2016 ජනවාරි 01 දිනට මව් සමාගමේ ගිණුම්වල ගෙවිය යුතු ලෙස පෙන්නුම් කරන ලද රු.4,496,257 ක් පොත්වලින් ලියාහැරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් 2016 පෙබරවාරි 08 දින දී ගෙන තිබුණි. මෙම ශේෂය සමාලෝචිත වර්ෂය තුළ රඳවා ගත් ලාභයට බැර කර තිබුණ ද කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි වගන්ති 3.2 (අ) ප්‍රකාරව විධිමත් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

(ii) කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් හි වගන්ති 10.21 පරිදි, 2015 දෙසැම්බර් මාසයට අදාළ නමුත් 2016 පෙබරවාරි මාසයේදී ගෙවන ලද වැටුප් හා වේතන රු.120,746 ක වටිනාකමක් අතීතයානුයෝගීව නැවත ප්‍රකාශ කිරීම් සිදුකර නොතිබුණි.

### 2.2.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම (කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 4.4 වගන්තිය - රු.130,597,000 ක හිඟව පවතින සේවක ණය ප්‍රමාණය ජංගම සහ ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කර පෙන්නුම් කර නොතිබුණු අතර, පුවත්පත් නියෝජිතයන්, නිත්‍ය දැන්වීම්කරු සහ අනෙකුත් යන අය තැන්පත් කරන ලද එකතුව රු.171,159,000 ක් එහි ස්වභාවය නොසලකා හැර ජංගම නොවන වගකීම් ලෙස දක්වා තිබුණි.

(ආ) 7.8(අ), (ආ) සහ (ඇ) වගන්තිය - අනෙකුත් ණයගැතියන් සහ අනෙකුත් ලැබිය යුතු දෑ සඳහා වන අඩමාන ණය වෙන් කිරීම්වල වෙනස්වීම් බලපෑම වූ පිළිවෙලින් රු.6,015,000 ක් සහ රු.4,527,000 ක් සහ ඉවත් කරන ලද වත්කම් වලින් ඇති වූ අලාභයේ වටිනාකම වූ රු.3,969,452 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහයට ළඟා වීමේ දී විධිමත්ව ගලපා නොතිබුණි.

(ඇ) 13.4 වගන්තිය - නිවිස් ප්‍රින්ට්, වාණිජ මුද්‍රණ ද්‍රව්‍ය සහ යන්ත්‍ර අමතර කොටස් ආදී වශයෙන් වූ අවසාන තොගය ඒවායේ ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීමකින් තොරව රු.327,509,000 ක් ලෙස පිරිවැයට අගය කර තිබුණි.

(ඈ) 17.19 වගන්තිය - රු.984,000,000 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවකාලය සමාලෝචනය කිරීමෙන් තොරව අඛණ්ඩව භාවිතා කර තිබුණි.

(ඉ) 21.14 වගන්තිය - සමාගමට විරුද්ධව පවරා ඇති නඩු 31 කට අදාළව වගකීම්වල ස්වභාවය සහ බලාපොරොත්තු වන වටිනාකම හා ගෙවීම් කළයුතු කාලය පිළිබඳව සැකෙවින් විස්තර හෙළිදරව් කර නොතිබුණි.

(ඊ) 28.41 වගන්තිය - සමාගම විසින් මෙම වගන්තියේ පරිදි අදාළ තෙරතුරු හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) ප්‍රමාද වී පැමිණීම හේතුවෙන් 2016 වර්ෂයට පෙර සේවකයන්ගේ වැටුප් වලින් අඩු කරන ලද රු.12,338,537 ක් රඳවාගත් ඉපයීම්වලට ගැළපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වැටුප් ගිණුමට බැරකර තිබුණි. ඒ හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) රු.149,213,666 ක අලාභයක් ලෙස වෙන්ව දැක්වීමකින් තොරව පැරණි පුවත්පත් අලෙවියෙන් ලැබුණු මුදල් සහ එම පුවත්පත්වල පිරිවැය වූ රු.32,114,000 ක් සහ රු.181,327,666 ක් පිළිවෙලින් අනෙකුත් ආදායම් සහ විකුණුම් පිරිවැය ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාගමේ විශ්‍රාම ප්‍රතිලාභ වගකීමට අදාළ පාරිතෝෂික භාර අරමුදලේ රඳවා ඇති පිළිවෙලින් රු.264,877,000 ක් සහ රු.285,688,000 ක් වූ සැලසුම් වත්කම් සහ සැලසුම් වගකීම් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

**2.2.2.3 නොසැසඳූ ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වන ලද ණයගැති ශේෂය සහ සමාගමේ බෙදාහැරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලේඛනයේ රු.8,513,049 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාගමේ වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යන ලේඛනයේ සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ආදායමේ රු.2,412,971 ක එකතු වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඇ) සැසඳුම් පිළියෙල කරන ලද විෂයයන් 16 ට අදාළව ලෙජරයේ දැක්වෙන වටිනාකම සහ භෞතිකව සමීක්ෂණය කරන ලද තොග වටිනාකම අතර රු.19,207,312 ක එකතු වෙනස්කම් නිරීක්ෂණය විය. කෙසේ වුවද සැසඳීම් පිළියෙල කිරීමෙන් පසුවද, තවදුරටත් රු.1,314,480 ක වෙනස්කම් නිරීක්ෂණය විය. තවද, තොග විෂයයන් 10 ට අදාළව පූර්ව වර්ෂ වැරදි එකතුව වූ රු.3,534.051 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද ගැළපීම් නොකර පැවතුණි.

(ඈ) ගනුදෙනුකරුවන්ගේ පුද්ගලික ලෙජර් ගිණුම් අනුව, දැන්වීම් නියෝජිතයන් සඳහා ගෙවන ලද පොලී මුදල රු.2,977,811 ක් විය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එය රු.2,297,074 ක් ලෙස දක්වා තිබුණි. එම නිසා රු.680,737 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වසරක සිට වසර පහ දක්වා සහ වසර පහට වැඩි කාල පරිච්ඡේදයක් දක්වා විහිදුනු, බැංකු ගිණුමකට ලද එකතුව රු.326,366 ක් වූ මුදල් ඇණවුම් 88 ක් උපලබ්ධි නොවී හිඟව පැවතුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට වූ වෙළඳ ණයගැතියන් රු.796,711,000 න් රු.101,547,882 ක් වසරකට වඩා හිඟව පැවතුණි. තවද, මෙම ශේෂයෙන් රු.28,061,903 ක් හෙවත් සියයට 28 ක් නීතිමය කටයුතු සඳහා නීති අංශයට යොමු කර තිබුණි. කෙසේ වුවද, නීති අංශයට යොමු කරන ලද එම ණය ගැතියන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු ඉටුකිරීම වසර 5 සිට 18 දක්වා සැලකිය යුතු තරමේ ප්‍රමාදවීම් නිරීක්ෂණය වී තිබුණි. වැඩිමනත් වශයෙන්, රු.6,266,419 ක වසර දෙකකට වඩා ශේෂ හිඟව පැවති ගිවිසුම් කඩකල සහ අවසන් කළ දැන්වීම් නියෝජිත ආයතන සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක් ද නීතිමය කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී "මිහින්තලේ ආලෝක පූජාව" වෙනුවෙන් සමාගම විසින් දරන ලද රු.1,610,430 ක මුදල වියදම් ලෙස හඳුනා ගැනීම වෙනුවට ලැබිය යුතු ලෙස වාර්තා ගත කර තිබුණි.

(ඉ) සමාගම සමග ඔවුන්ගේ දායකයන් පවත්වාගෙන නොගිය ගනුදෙනුකරුවන් වෙත සමාගම විසින් 2016 දෙසැම්බර් 31 දිනට රු.8,548,322 ක් වටිනා පුවත්පත් නිකුත් කර තිබුණි. එම ප්‍රමාණයෙන් රු.4,065,309 ක් 2011 සිට 2015 දක්වා හිඟව පැවතුණි. කෙසේ වුවද 2017 අගෝස්තු 31 දින වන විට මුළු හිඟ ශේෂය රු.5,775,258 ක් දක්වා අඩු වී තිබුණි.

### 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114(1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය | සමාලෝචිත වර්ෂය තුළදී සේවකයින්ට ගෙවන ලද ප්‍රසාද දීමනා සඳහා උපයන විට ගෙවීම් බදු (PAYE) ලෙස රු.5,163,583 ක මුදලක් සේවකයින්ට ගෙවන ලද ප්‍රසාද දීමනාවලින් අයකර ගැනීමෙන් තොරව සමාගම විසින් ගෙවා තිබුණි. |
| (ආ) රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12-9.2 (අ) වගන්තිය | සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සංයුක්ත සැලැස්මේ ඇතුළත් කළ යුතුය. එසේ වුවද 2013 සිට 2016 දක්වා කාලපච්ඡේදය සඳහා පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මේ 2006 ජූලි 31 දිනට සහ 2013 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව පමණක් ඇතුළත් කර තිබුණි. |
| -9.3.1 වගන්තිය | සෑම රාජ්‍ය ව්‍යවසායයක්ම එක් එක් තනතුර සඳහා බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමක් සකස්කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහ මහා භාණ්ඩාගාරයේ එකඟත්වය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය හා අදාළ අමාත්‍යාංශය විසින් අනුමත කරවාගත යුතුය. කෙසේ වුවද සමාගම විසින් බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමයක් පිළියෙල කර නොතිබුණි. |
| (ii) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී 3/2015 | සමාගම රජයට අයත් ව්‍යවසායක් බවට වර්ගීකරණය කර තිබුණද, මුදල් අමාත්‍යාංශයෙන් හෝ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද කිසිදු නිර්දේශයක් මේ දක්වා අනුගමනය කර නොතිබුණි. 2017 ජුනි 29 දිනැති අධ්‍යක්ෂ මුදල්ගේ ලිපියෙන් මේ සම්බන්ධයෙන් කළමනාකරණය "පීඊඩී චක්‍රලේඛයන්ගෙන් බැහැර වීම සඳහා මුදල් අමාත්‍යවරයා සමග සාකච්ඡාවක් පැවැත්වූ බව" මා වෙත දන්වා තිබුණි. කෙසේ වුවද, එවැනි අනුමැතියක් මේ දක්වා ද ලැබී නොතිබුණි. |
| (iii) 2016 දෙසැම්බර් 16 දිනැති අංක පීඊඩී 5/2016 | ලාභ උපයාගෙන ඇති සහ පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත දිරි දීමනා ගෙවනු ලබන සමාගම් විසින් 2016 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ලෙස රු.13,500 ක් පමණක් ගෙවිය හැකිය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේදී මූලික වැටුපෙන් මාස 4 1/2 ක් යන පදනම මත එකතුව රු.මිලියන 168.8 ක් ප්‍රසාද දීමනා ලෙස සමාගම විසින් ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන සහ සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.40,631,000 ක් සහ රු.29,008,000 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.26, 111,000 ක් සහ

රු.16,204,000 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.14,520,000 ක සහ රු.12,804,000 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය සඳහා දැන්වීම් ආදායම රු.2,548,682,715 න් වැඩි වීම ප්‍රධානා වශයෙන් හේතු වී තිබුණි.

2015 සහ 2016 වර්ෂ සඳහා වැටුප්, බදු හා ක්ෂය (ලාභාංශ සහ සාධාරණ අගය ගැළපීමට පෙර) සැලකිල්ලට ගැනීමෙන් පසු සමාගමේ අගය එකතු කිරීම පිළිවෙලින් රු.1,784,471,000 ක් සහ රු.2,153,741,000 ක් වූයෙන් එය සියයට 20.7 ක අගය එකතු වීමේ වර්ධණයක් පෙන්නුම් කර තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 වැදගත් ගිණුම්කරණ අනුපාත

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සාමගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | 2016<br>ප්‍රතිශතය | 2015<br>ප්‍රතිශතය |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 53.69 | 53.20 |
| ලකුණු කළ ලාභය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 115.92 | 113.68 |
| පිවැටුම මත පරිපාලන පිරිවැය | 43.85 | 43.43 |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 10.86 | 11.10 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 1.64 | 2.00 |
| ද්‍රවශීලතා අනුපාතය | 2.12 | 2.05 |
| ක්ෂණික අනුපාතය | 1.60 | 1.58 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලකුණු කළ ලාභය පිළිවෙළින් සියයට 0.49 කින් හා සියයට 2.24 කින් පමණක් වැඩි වි තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

1973 අගෝස්තු 04 දිනැති අංක 71/1 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1973 අංක 28 දරන ඇසෝසියේටඩ් නිව්ස් පේපර්ස් ඔෆ් සිලෝන් ලිමිටඩ් (විශේෂ විධිවිධාන) පනතේ වගන්තිය 2 සහ 17 පරිදි, සමාගමේ ප්‍රධාන අරමුණු (i) යම් ප්‍රවෘත්ති පත්‍රයක් හෝ වෙනත් ප්‍රකාශන ආරම්භ කිරීම, අත්කර ගැනීම, මුද්‍රණය කිරීම, පළ කිරීම හා බෙදාහැරීම සහ මුද්‍රණකරුවන්, ලිපි ද්‍රව්‍ය වෙළඳුන්, යන්ත්‍ර රූල්කරුවන්, අංක මුද්‍රණකරුවන්, ලිතෝ මුද්‍රණකරුවන්, අකුරු වාත්තුකරුවන් ආදී දෑ පිළිබඳ සියලුම ව්‍යාපාර හෝ ඒවායින් යම් ව්‍යාපාරයක් කරගෙන යාම (ii) කැටයම් කැපීම, මුද්‍රණ, පින්තූර චිත්‍ර සහ ප්‍රචාරක නියෝජිතයන්ගේ, ප්‍රචාරක කොන්ත්‍රාත්කරුවන්ගේ සහ ප්‍රචාරක සැලසුම්කරුවන්ගේ, නිෂ්පාදකයින්ගේ, නියෝජිතයන්ගේ, බෙදාහරින්නන්ගේ හා වෙළඳුන්ගේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම (iii) චිත්‍රපට සහ පින්තූර, විනෝදාංශ, සංගීතය සහ ශබ්ද යාන්ත්‍රිකව නැවත නිපදවීම හෝ සම්ප්‍රේෂණය කිරීම හා සම්බන්ධ වෙනත් උපකරණ හා යන්ත්‍ර නිෂ්පාදකයින් පිළිබඳ ව්‍යාපාර කටයුතු කරගෙන යාම (iv) සංචාරක නියෝජිතයන් ලෙස ව්‍යාපාර කරගෙන යාම වේ.

සමාලෝචිත වර්ෂය තුළ ඉහත සඳහන් අරමුණු ක්‍රියාත්මක කිරීම පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගම විසින් සමාලෝචිත වර්ෂ්‍ය තුළ වර්ග 06 ක පුවත්පත් හා වර්ග 09 ක වාර සඟරා ප්‍රසිද්ධ කර තිබූ අතර, ඉකුත් වර්ෂය තුළදී පුවත්පත් 06 ක්, සහ වාර සඟරා 25 ක් විය. කෙසේ වුවද 2015 දී ප්‍රසිද්ධ කරන ලද වාර සඟරා 11 ක් නවතා දමා තිබුණු අතර, ප්‍රසිද්ධ කරන ලද තවත් වාර සගරා 05 ක් සමාලෝචිත වර්ෂය තුළ පාඨකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා අතිරේක වශයෙන් දිනමිණ සහ සිළුමිණ පුවත්පත් සමග නිකුත් කර තිබුණි. තවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් අලෙවිකරණයට අදාළ වියදම් රු.මිලියන 14 න්

හෙවත් සියයට 49 ක් වැඩි වී තිබුණි. කෙසේ වුවද, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් 06 න් සහ වාර සඟරා 07 න් ලැබූ සමස්ත විකුණුම් ආදායම රු.මිලියන 67.9 ක් පහත වැටී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් 6න් සහ වාර සඟරා 8 න් අලෙවිකරණ ලද පිටපත් සංඛ්‍යාව 2,367,491 හෙවත් සියයට 10 න් අඩු වී තිබුණි. කෙසේ වුවද, "මිහිර" නමැති වාර සඟරාව පමණක් 2016 වර්ෂයේදී විකුණුම් ධාරිතාවයේ වර්ධනය වන නැඹුරුවක් පෙන්නුම් කර තිබුණි. 2016 වර්ෂයේදී පුවත්පත් 06 ක සහ වාර සඟරා 07 ක මුද්‍රණය කරන ලද පිටපත් සංඛ්‍යාවේද, පිටපත් 1,972,647 ක හෙවත් සියයට 07 ක සමස්ත පහළ යාමක් විය.

(ඇ) වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුව වසා දැමීම සහ රජයේ පාසල් පෙළ පොත් හා දුරකථන නාමාවලින් මුද්‍රණය නවතා දැමීම නිසා, වාණිජ මුද්‍රණ අංශයෙන් සහ වාර්ෂික ප්‍රකාශනයන්ගෙන් 2015 දී ඉපයූ ආදායම රු.මිලියන 315.8 ක සිට රු.මිලියන 51.4 ක් දක්වා හෙවත් සියයට 84 කින් 2016 වර්ෂයේදී පහත වැටී තිබුණි.

(ඈ) දැන්වීම් ගාස්තු ඉහළ දැමීම සහ දැන්වීම් වැඩි ප්‍රමාණයක් සමාගමට ආකර්ෂණය කරගැනීම සඳහා දැන්වීම්/ අලෙවි කළමනාකරුවන්ට දිරි දීමනා යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම හේතුවෙන්, පසුගිය වර්ෂයට සාපේක්ෂව සමස්ත දැන්වීම් ආදායම රු.මිලියන 459 ක් හෙවත් සියයට 22 න් වර්ධනය වී තිබුණි.

(ඉ) සමාගමේ ප්‍රධාන කාර්යාලයේ පරිශ්‍රයන් දෙකක් කල්බදු දීමට මහජන බැංකුව සහ ලංකා බැංකුව සමග කල්බදු ගිවිසුම්වලට එළඹ තිබුණු අතර, බදු ආදායම ලෙස සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 33.4 ක් උපයා තිබුණි. කෙසේ වුවද, 2016 වර්ෂය තුළ මෙම කුලී ආදායම උපයා ගැනීමට නොහැකි වූයේ නම් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1.04 ක ශුද්ධ අලාභයක් ලැබීමට තිබුණි.

### 4.2 කළමනාකරණ කටයුතු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2013 වර්ෂය තුළදී එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලද ලේක්හවුස් කනෙක්ට් (පුද්ගලික) සමාගම (බිස්නස් ලංකා ඒඑන් (පුද්ගලික) සමාගම ලෙස පෙර හඳුන්වන ලද) 2016 දෙසැම්බර් 31 දිනට රු.19,433,501 ක එකතු අලාභයක් ලබා තිබුණි. විධිමත් අයකර ගැනීමේ ප්‍රතිපත්තියක් නොමැති වීමෙන් අඩමාන ණය සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට වෙළඳ ණයගැතියන්ගේ ශේෂය රු.15,542,704 ක් සහ අඩමාන ණය වෙන්කිරීම් රු.14,456,255 ක් විය.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට ඔබ්සවර් ජොබ්ස් (පුද්ගලික) සමාගමේ (පෙර ඉන්ෆෝ මීඩියා (පුද්ගලික) සමාගම ලෙස හඳුන්වන ලදා) එකතු අලාභය රු.11,615,486 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ එහි රු.1,686,480 ක ඉපැයූ ආදායමට සාපේක්ෂව රු.5,437,267 ක් හෙවත් සියයට 322 ක් වැටුප් හා වේතන ලෙස ගෙවා තිබුණි. අඛණ්ඩ අලාභ ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය 2016 පෙබරවාරි 08 දින මෙම පරිපාලිත සමාගමෙන් ලැබිය යුතු රු.4,496,257 ක් පොත්වලින් ලියාහැරීමට තීරණය කර තිබුණි.

(ඇ) දේපළ සංවර්ධන ව්‍යාපාරයේ නිරත වීම සඳහා 1985 දී පිහිටුවන ලද ලේක්හවුස් ප්‍රෝපර්ටි ඩිවලොප්මන්ට් (පුද්ගලික) සමාගම සමාලෝචිත වර්ෂය අවසානය වන විටත්, මෙහෙයුම් කටයුතුවලින් කිසිදු මුදල් ප්‍රවාහයක් ජනිත කර නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් වන විට අගරු චෙක්පත්වල එකතු වටිනාකම රු.10,585,138 ක් විය. මෙයින් රු.5,018,153 ක් වටිනා චෙක්පත් 82 ක් වසරකට වඩා හිඟව පැවති ඒවා විය. කෙසේ වුවද, රු.2,501,495 ක් වටිනා අගරු චෙක්පත් 31 ට එරෙහිව පමණක් නීතිමය පියවර ගෙන තිබුණි.

(ඉ) සමාගම ලංකා පුවත්පත් සමාගමෙන් (නැෂනල් නිව්ස් ඒජන්සි ඔෆ් ශ්‍රී ලංකා) කොටස් 2400 ක් මිලදී ගැනීම සඳහා අතුරු ගෙවීමක් ලෙස රු.මිලියන 1.2 ක් ගෙවා තිබුණද, මෙම ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දැන්වීම් නියෝජිතයන් ඔවුන් හිඟිසුම්වලට එළඹෙන විට සමාගමේ තැන්පත් කරන ලද තැන්පත් සඳහා සමාගම වාර්ෂිකව සියයට 10 ක පොලියක් ගෙවා තිබුණි. කෙසේ වුවද, තැන්පතු සීමාව, එවැනි පොලියක් ගෙවීමට තීරණය කිරීම සහ පොලී අනුපාතය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුළ පුවත් නියෝජිතයන් 460 ට පොලී ලෙස රු.2,977,811 ක ප්‍රමාණයක් ගෙවා තිබුණද, මේ සම්බන්ධයෙන් ආයෝජන සැලැස්මක් හඳුන්වා දී නොතිබුණි. පසුව මෙම පුවත් නියෝජිතයන් වෙත ඔවුන් සමාගමට ඇති ණය පියවීමේ දී දින 50 ක ණය කාල සීමාවක් ලබාදී තිබුණි.

### 4.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

නිවාස යෝජනා ක්‍රමයක් ඉදිකිරීම සඳහා මිලදී ගෙන තිබුණු හෝකන්දර පිහිටි අක්කර 8 ක ඉඩම, 1985 සිට නිෂ්කාර්යව පැවතුණි.

### 4.5 හඳුනාගන්නා ලද පාඩු

2012 සිට 2015 කාලපරිච්ඡේදය දක්වා මුද්‍රිත පොත් සැපයීමේ ප්‍රමාදය හේතුවෙන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට රු.642,908 ක දඩයක් සමාලෝචිත වර්ෂයතුළ ගෙවීමට සිදු වී තිබුණි.

### 4.6 මානව සම්පත් වෙනත් ආයතනවලට මුදා හැරීම

2003 ජුනි 02 දිනැති අංක 12 දරන පීඊඩී චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් කලාවේදීන් දෙදෙනෙකු ආශ්‍රිත කර්තෘවරයෙකු, කළමනාකාර කර්තෘවරයෙකු සහකාර සාමාන්‍යාධිකාරී - කාර්මික, ඡායාරූප ශිල්පියෙකු, පෘෆ් කියවන්නෙකු, සහකාර කළමනාකාරවරයෙකු හා සාමාන්‍ය සහකාරවරයෙකු ඇතුළත් නිලධාරීන් නවදෙනෙකු වෙනත් රජයේ ආයතනවල සේවය සඳහා මුදාහැර තිබුණි. ඔවුන් වෙනුවෙන් වැටුප්, වේතන හා දීමනා ලෙස රු.9,512,682 ක මුදලක් සමාගම විසින් වැයකර තිබුණි. පුවත්පත් කලාවේදීන් දෙදෙනෙකු මුදාහැර තිබුණද, සමාලෝචිත වර්ෂය තුළ නව පුවත්පත් කලාවේදීන් හය දෙනෙකු බඳවා ගෙන තිබුණි.

### 4.7 කාර්ය මණ්ඩල කළමනාකරණය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) සමාගම විසින් කාර්ය මණ්ඩල කළමනාකරණය සඳහා අනුගමය කළ යුතු ප්‍රතිපත්ති හා පටිපාටි පිළියෙළ කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ රු.8,041,274 ක් ගෙවමින් මානව සම්පත්, තොරතුරු තාක්ෂණය හා අභ්‍යන්තර විගණන ක්ෂේත්‍රයන්හි උපදේශකවරුන් කිහිප දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණද, සමාගමේ කාර්ය සාධනය ඉහළ දැමීමට ඔවුන්ගෙන් වූ දායකත්වය නිශ්චය කිරීම සහ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීම සිදුකර නොතිබුණි.

(ඇ) සමාගමේ ක්‍රියාකාරී සැලැස්මට අනුව, සේවකයන්ගේ කුසලතා දියුණු කිරීම සඳහා රැකියා විශ්ලේෂණයක් ක්‍රියාත්මක කිරීමට සහ දැනුම, කුසලතා හා සේවකයන්ගේ ප්‍රවීණත්ව මට්ටම් තක්සේරු කිරීමට සැළසුම් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ එවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි. සැලසුම් කළ පරිදි දේශීය පුහුණුවීම් වලින් සියයට 25 ක් සහ විදේශීය පුහුණුවීම් වලින් සියයට 50 ක් පමණක් සපයා තිබුණි. තවද, විදේශීය පුහුණුවීම් වලට අදාළව නිලධාරීන්ගේ නම, ඒ සඳහා දරන ලද පිරිවැය, සංචාරයේ අරමුණ සහ සමාගමට ලද අගය එකතු වීම පිළිබඳ තොරතුරු විගණනයට සපයා නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට සමාගම විසින් පිළියෙල කරන ලද අනුමත සේවක සංඛ්‍යාව අනුව, සමාගමේ කර්තෘ දෙපාර්තමේන්තුවේ සහ සාමාන්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ සේවකයන් 98 ක් අතිරික්තව සහ සේවකයන් 181 ක් පුරප්පාඩුව පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ හඳුන්වා දෙන ලද ස්වෙච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය (VRS) යටතේ වන්දි ලෙස රු.163,513,000 ක් ගෙවීමෙන් පසුව විවිධ තනතුරු වලින් සේවකයන් 177 ක් සමාගමෙන් ඉවත් වී තිබුණද, ස්ථිර පදනමින් සේවකයින් 05 ක් සහ කොන්ත්‍රාත් පදනමින් සේවකයින් 105 ක් 2016 දී අලුතින් බඳවාගෙන තිබුණි.

## 05. ගිණුම් කටයුතු භාවය හා යහ පාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී / 12 හි වගන්ති 5 අනුව සමාගම විසින් 2013/ 2016 කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර තිබුණි. කෙසේ වුවද, ලබාගත හැකි වර්තමාන සම්පත්, සංවිධාන ව්‍යුහය, ඉකුත් වර්ෂ 3 ක මෙහෙයුම් ප්‍රතිඵල ආදී වැදගත් ලක්ෂණයන් එහි ඇතුළත් කර නොතිබූ අතර, සංස්ථාපිත අරමුණු ඉටුකර ගැනීම, විශේෂයෙන් පුවත්පත් කර්මාන්තයේ ප්‍රධාන අලෙවිකරුවීම සඳහා උපාය මාර්ග සකස් කර ගැනීම, මෙහෙයුම් හා අලෙවි සැලසුම් ක්‍රියාත්මක කිරීම, නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය වැඩි දියුණු කිරීම පිළිබඳව කළමනාකරණය විසින් ඇගයීමකට යොමු කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්මට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ වෙබ් සහ සමාජ මාධ්‍ය සඳහා අලෙවිකරණ සැලසුමක් ගවේෂණය කිරීම සහ පිහිටුවීම, දැන්වීම් අවස්ථා නිර්මාණය කිරීමට නිෂ්පාදන තේමා පුළුල් කිරීම, පවත්නා සේවා දායකපදනමට අගය එකතු කිරීම් පිරිනැමීම, වෙබ් මුද්‍රිත කලාවේ නවීන තත්ත්වයන් අත්පත් කර ගැනීම සහ සේවකයන්ගේ මානව සම්පත් ප්‍රතිපත්ති, පරිපාටි සහ කුසලතා ඉහළ දැමීම වැනි දෑ ඉලක්කගත කළ පරිදි ඉටුකර ගෙන නොතිබුණි.

### 5.3 විගණන කමිටු

විගණන කමිටුව අවම වශයෙන් විධායක නොවන සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත යුතු අතර, භාණ්ඩාගාර නියෝජිතයකු හෝ මූල්‍ය කළමනාකරණ කුසලතා දරන පුද්ගලයෙකු විසින් සභාපතිත්වය දැරිය යුතුය. කෙසේ වුවද, එම රැස්වීම්වලට සහභාගි වූ අධ්‍යක්ෂවරුන් විධායක නොවන හෝ භාණ්ඩාගාර නියෝජිතවරයෙකු වී නොතිබුණි.

### 5.4 අයවැය පාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන පීඊඩී චක්‍රලේඛයේ 5.2.3 වගන්තිය අනුව. අයවැය ලේඛනය පිළියෙල කිරීම හා එය රේඛීය අමාත්‍යාංශයට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම සඳහා කාල ඉලක්කයන් අනුගමනය කර නොතිබුණි.

(ආ) අයවැය ගත හා තථ්‍ය සංඛ්‍යා අතර සියයට 25 සිට සියයට 256 දක්වා පරාසයක සැලකිය යුතු බැහැරවීම් නිරීක්ෂණය වූයෙන් අයවැය ඵලදායි කළමනාකරණ කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

### 5.5 නොවිසඳුනු විගණන කරුණු

ඉකුත් වර්ෂයේ කරන ලද විගණන වාර්තාවෙන් අවධාරණය කරන ලද පහත සඳහන් කරුණු සඳහා නිසි සැලකිල්ලක් යොමු කර නොතිබුණි.

(i) ලේක්හවුස් ප්‍රොපටි ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගමේ හා ඔබ්සවර් ජොබ්ස් පුද්ගලික සමාගමේ ආයෝජනය කරන ලද පිළිවෙලින් රු.7,500,000 ක් හා රු.2,500,000 ක් වූ ආයෝජනයන් මත කිසිදු ප්‍රතිලාභයක් නොලැබීම.

(ii) ලෙජර ශේෂයන් හා අනුරූපී එක් එක් දෙපාර්තමේන්තුවල නඩත්තු කරන ලේඛන අතර, වෙනස්කම් නිරූපණය වීම.

(iii) 2013 දෙසැම්බර් 09 දින පැවති පොදු ව්‍යාපාර කමිටුවේ සාකච්ඡා කරන ලද පරිදි පුවත්පත් 06 ක අලෙවියේ අඛණ්ඩ පහත වැටීම.

# විගණකාධිපතිතුමාගේ වාර්තාව

## 06. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා සමාගමේ සභාපතිගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | **ක්ෂේත්‍රය** | | **නිරීක්ෂණය** |
|---|---|---|---|
| | ---------- | | ------------- |
| (අ) | ණයගැති කළමනාකරණය | - | සනාථ නොකරන ලද ණයගැතියන්ගේ ශේෂ සමාලෝචනය නොකිරීම. |
| (ආ) | ඉන්වෙන්ට්‍රි පාලනය | - | ලෙජර ශේෂ හා සත්‍යාපනය කරන ලද තොග ශේෂ අතර වෙනස්කම් |
| | | - | සැසැඳුම් සකස් කළ පසුවද හඳුනා නොගත් ප්‍රමාණයන් ලෙජරය තුළ පැවතීම |
| (ඇ) | අලෙවි ආදායම | - | පුවත්පත් විකුණුම් ආදායම අඩුවීම සහ වාර සඟරා 11 ක් නවතා දැමීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | - | සේවකයන්ගේ කුසලතා වැඩි දියුණු කිරීමට පුහුණු වැඩ සටහන් නොමැති වීම. |
| | | - | අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටි නොවීම |
| | | - | සමාගමේ කාර්ය සාධනය ඉහළ දැමීමට උපදේශකවරුන් සපයන ලද දායකත්ව ඇගයීම් නොකිරීම |
| (ඉ) | පසු - සේවක ප්‍රතිලාභ | - | පාරිතෝෂික භාර අරමුදලේ රඳවා ඇති සැලසුම් වත්කම් සහ සැලසුම් වගකීම් හෙළිදරව් නොකිරීම. |



**එච්.එම්. ගාමිණී විජේසිංහ**
විගණකාධිපති

# විගණන නිරීක්ෂණ පිළිබඳ සභාපතිතුමාගේ නිර්දේශ

2.2 ගිණුම් සඳහා පිළිතුරු

2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

**ලේක්හවුස් කනෙක්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**

i. පිළිගනිමි. සඳහන් කරන ලද දෑ අනාගතයේදී වැඩිදියුණු කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.
ii. එකඟ වෙමි. සඳහන් කරනලද දෑ අනාගතයේදී නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ.
iii. පිළිගනිමි.

**ලේක්හවුස් ප්‍රොපටි ඩිවලප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්**

i. පිළිගනිමි. අභ්‍යන්තර ගිණුම් පාලන මාර්ග ඉදිරි වසරේදී ක්‍රියාත්මක කෙරෙනු ඇත.
ii. පිළිගනිමි.
iii. පිළිගනිමි. අදාළ ක්‍රියාමාර්ග ඉදිරි වසරේදී ක්‍රියාත්මක කෙරෙනු ඇත.

**ඔබ්සර්වර් ජොබ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

i. පිළිගනිමි.
ii. පිළිගනිමි. 2017 වසරේ ගිණුම් ප්‍රකාශන නිවැරදි කිරීමට අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

2.2.2 සමාගමේ මූල්‍ය ප්‍රකාශන

2.2.2.1 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

අ) ඡේද 4.4
සේවක වැටුප් කටයුතු සඳහා ලේක්හවුස් ආයතනය AS 400 පැකේජය භාවිතා කර ඇත. සේවක අයවීම් කෙටි කාලීන සහ දිගුකාලීන වශයෙන් වෙන් කොට දැක්වීම සඳහා මෙම පැකේජයේ පහසුකමත් නොමැත. AS 400 පැකේජයේ පවතින මෙවැනි අඩු ලුහුඬුකම් හේතු කොට ගෙන සේවක වැටුප් කටයුතු සඳහා පුළුල් මානව සම්පත් තොරතුරු පද්ධතියක් ක්‍රියාවට නැංවීමට කළමනාකාරිත්වය තීරණය කර ඇත. 2017 අගෝස්තු මස සිට සේවක වැටුප් කටයුතු සිදු කරනු ලබන්නේ එච් සෙනිඩ් බිස්නස් සොලියුෂන්ස් ප්‍රයිවට් ලිමිටඩ් මගින් හඳුන්වා දෙන ලද මෙම නව මානව සම්පත් තොරතුරු පද්ධතිය මගිනි. මෙම නව මානව සම්පත් තොරතුරු පද්ධතිය මගින් මෙම වසරේ සිට සේවක අයවීම් කෙටිකාලීන හා දිගුකාලීන වශයෙන් වෙන්කොට දැක්වීමට හැකිවනු ඇත.

ආ)(ii) ඡේද 7.8 (අ, ආ, ඇ)
මෙම වාර්තාවේ පෙන්වා දී ඇති අයිතම නිවැරදි කිරීම සඳහා 2017 වසරේදී ක්‍රියාමාර්ග ගනු ඇත.

ඇ) ඡේද 13.4
පිළිගනිමි. සියලුම තොග පරිභෝජනීය අයිතම වන අතර, වෙළඳ තොග නොවේ. එම නිසා අප විසින් ඇස්තමේන්තුගත විකුණුම් මිල සළකා බලනු නොලබයි. ආයතනය තොග තක්සේරු කරනු ලබන්නේ පිරිවැය මිල පදනම් කර ගෙනය.

ඈ) ඡේද 17.19
නව ව්‍යාපාර සම්පත් කළමනාකරණ පද්ධතිය ක්‍රියාවට නැංවීමෙන් පසුව වත්කම් වල ඵලදායි ජීවිත කාලය පරීක්ෂා කිරීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ඉ) ඡේද 21.14
සටහන් කර ගන්නා ලදී. කෙසේ වුවත් වන්දි මුදලේ ස්වභාවය සහ ප්‍රමාණය හේතු කොට ගෙන, අපගේ මූල්‍ය ප්‍රකාශන වල විසඳීමට තිබෙන නඩු පිළිබඳ තොරතුරු අනාවරණය කිරීමට ආයතනය අපොහොසත් වී ඇත. විනිශ්චය සඳහා නියමිත ආයතනයට විරුද්ධව එබඳු නඩු 31 ක් ඇත. එම නඩු වලට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 18 හි අනාවරණය කර ඇත.

ඊ) ඡේද 28.41
ඡේද 28.19 ට අනුකූලව අදාළ අනාවරණය කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. පාර්තෝෂි දීමනා වලට අදාළ ගිණුම් ප්‍රකාශන වල මේ සම්බන්ධ විස්තරාත්මක තොරතුරු දක්වා ඇත. කෙසේ වුවද අමතර අනාවරණය කිරීම් ඉදිරි වර්ෂයේදී ලේක්හවුස් ගිණුම් ප්‍රකාශන වල දක්වනු ඇත.

2.2.2.2 ගිණුම්කරණ ඌණතා

අ) ප්‍රමාදවී පැමිණීම් ආයතනයේ වැටුප් වියදම් වලින් අඩු කරනු ලැබේ. එමනිසා සළකාබලන වර්ෂයේ වැටුප් වියදම් වලින් අය කිරීමක් ලෙස දක්වා ඇත. ඒ අනුව විස්තරාත්මක ආදායම් ප්‍රකාශනය තුළ වෙනත් ආදායමක් ලෙස නොදක්වා වැටුප් වියදම් වලින් අඩු කරනු ලැබුවද බදු පෙර ශුද්ධ ලාභයට

# විගණන නිරීක්ෂණ පිළිබඳ සභාපතිතුමාගේ නිර්දේශ

බලපෑමක් ඇති නොවේ. කෙසේ වුවද 2017 ගිණුම් වර්ෂයේ සිට ප්‍රමාද වී පැමිණීම් වෙනත් ආදායම් යටතේ විස්තරාත්මක ආදායම් ප්‍රකාශය තුළ දක්වනු ඇත.

ආ) එකඟ නොවේ. ආපසු එවන ලද පැරණි පුවත්පත් වලට අදාළ පිරිවැය දැනටමත් අදාළ වර්ෂයන්හි ආදායම් ප්‍රකාශන වල ඇතුළත් කර ඇත. එමනිසා විකුණුම් වලින් ලද මුළු මුදල වෙනත් ආදායමක් ලෙස හැඳින්විය හැකිය. තවද පැරණි පුවත්පත් විකුණනු ලබන්නේ කිලෝ ග්‍රෑම් පදනම මත වන අතර, ඒකක හෝ පුවත්පත් පදනම මත නොවේ. එම නිසා එම පැරණි පුවත්පත් වලට අදාළ පිරිවැය නිවැරදිව හඳුනාගැනීම ප්‍රායෝගික වශයෙන් අපහසු වේ. කෙසේ වුවද, මෙම ප්‍රතිපත්තිය යෙදීම මගින් ආදායමට හෝ වියදමට බලපෑමක් ඇති නොවේ.

ඇ) කරුණාකර 2.2.2.1 (ඊ) පිළිතුර වෙත යොමු වන්න.

**2.2.2.3 නොසැසඳූ ගිණුම්**

ආ) එකඟ නොවේ.
වයස් විශ්ලේෂණයට අදාළ ණයගැති ලෙජරයේ ශේෂය සහ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අගයන් අතර රුපියල් 8,513,049 ක වෙනසක් දක්නට නොලැබේ. ණයගැති ලෙජරයේ ශේෂයන් සහ හෝල් පෝටර්, පාසල් බෙදාහැරීම් වලට අදාළ වයස් විශ්ලේෂණ ණයගැති ලෙජරයේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂයන් කාලානුරූපි වෙනස්කම් මත සැසඳුනි. මෙම වෙනස්කම් ඒ සමගම සසඳන ලදී.

ආ) ඇතැම් හේතූන් මත සිදුකරන ලද අවලංගු කිරීම් වාණිජ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් පවත්වාගෙන යනු ලබන ආදායම් නාමලේඛනයෙහි ගලපා නැති අතර, එම ගැලපීම් අදාළ ලෙජරයෙහි සිදු කොට ඇත.

ඇ) 2016 නොවැම්බර් මස වාර්ෂික තොග සත්‍යාපනය සිදුකරන ලද අතර, එම කාලපරිච්ඡේදයේදීම සිදු වූ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමය යනාදී නොවැලැක්විය හැකි සිදුවීම් හේතුකොට ගෙන සැසඳුම් කිරීම ප්‍රමාද විය. කෙසේ නමුත් මෙම වෙනස්කම් වලට හේතු 2017 වසරේදී හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කෙරෙනු ඇත.

ඈ) තැන්පතු වලට අදාළ පොලී වියදම් අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් පුවත්පත් නියෝජිතයන් හට ගෙවන ලද පොලී සහ කැන්වසර්කරුවන් සහ මුදල් අයකැමිවරුන් හට ගෙවන ලද පොලී වලින් සමන්විත වේ. කෙසේ නමුත් 2015 ජූලි, අගෝස්තු, සැප්තැම්බර් යන මාසයන්ට අදාළ පුවත්පත් නියෝජිතන්ගේ තැන්පතු වලට අදාළ පොලී, පොලී වියදම් ගිණුමට දෝෂසහගත ලෙස දෙවරක් ඇතුළත්වී ඇත. මෙම දෝෂය 2016 මූල්‍ය වර්ෂයේදී හඳුනාගෙන එම වටිනාකම ප්‍රතිශෝධනය කර ඇත.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

අ) 2016 වසරේ සිට ලේක්හවුස් ආයතනය මුදල් ඇණවුම් උපලබ්ධි කිරීම සඳහා නව පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. මේ යටතේ ලේක්හවුස් ආයතනය සෘජුවම සේවාදායකයන්ගේ මුදල් ඇණවුම් ලබා ගන්නා අතර, තැපැල්පති හරහා එම ඇණවුම් යොමු කරනු ලැබේ. මෙමගින් ලේක්හවුස් ආයතනයට කඩිනමින් මුදල් ඇණවුම් ලබාගත හැකි වේ. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා පහත සඳහන් මුදල් ඇණවුම් හිඟව තිබේ. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා හිඟව පවතින මුදල් ඇණවුම් වල මුළු වටිනාකම රුපියල් 13,327 ක් වන අතර, මෙයින් 4% ක් වූ මුදල් ඇණවුම් ප්‍රමාණය 2007 වර්ෂයේ සිට හිඟව පවතී.

| වර්ෂය | වටිනාකම රුපියල් |
|---|---|
| 2012 | 3,492.00 |
| 2013 | - |
| 2014 | 2,896.00 |
| 2015 | 4,755.00 |
| 2016 | 2,184.00 |
| **එකතුව** | **13,327.00** |

ආ) වෙළඳ ණයගැතියන් යටතේ දක්වනු ලබන වර්ෂයකට අධික කාලයක් හිඟව පැවති රුපියල් 101, 547, 882 ක්වූ මුදල අඩමාණ ණය ලෙස වෙන්කර දක්වා ඇත. අපගේ සාමාන්‍ය පොලී ණය ප්‍රතිශතය මුළු ආදායමෙන් 0.05% කටත් වඩා අවම වේ.

ඇ) මිහින්තලා ආලෝක භාරය වෙන්ව පවතින ඒකකයන් වන අතර, එහි මූල්‍ය ප්‍රකාශන අවසන් වන්නේ මාර්තු 31 දිනෙන්ය. විගණනය කරන ලද වෙන්වූ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක් මෙම භාරයට අදාළව පවතී. එය ලේක්හවුස් ආයතනයට සැබැඳි වූ ඒකකයක් වේ. 2016 දෙසැම්බර් 31 දිනට පවතින අවසාන ශේෂය සබැඳි පාර්ශ්වයේ ප්‍රවර්තන ගිණුමෙහි ශුද්ධ ශේෂය නිරූපණය කරනු ලබයි.

ඈ) රාජ්‍ය අංශය යටතේ දක්වනු ලබන ග්‍රාහකයන් සඳහා නිකුත් කරනලද ණය හිඟව තිබෙන අගයන් පහත දක්වා ඇති පරිදි වෙනස් කළ යුතුව ඇත.

| වර්ෂය | 2016. 12. 31 දිනට හිඟ මුදල රුපියල් | 2017. 12.31 දිනට හිග මුදල රුපියල් | 2017.01.01 සිට 2017.08.31 දක්වා කරනලද පියවීම් |
|---|---|---|---|
| 2011 | 2,171,715.00 | 2,171,715.00 | 0.00 |
| 2012 | 1,051,979.00 | 1,051,979.00 | 0.00 |
| 2013 | 566,279.00 | 563,393.37 | 2,885.63 |
| 2014 | 149,093.00 | 129,095.05 | 19,997.95 |
| 2015 | 126,243.00 | 111,137.65 | 15,105.35 |
| 2016 | 4,483,013.00 | 1,747,938.00 | 2.735,075.00 |
| | **8,548,322.00** | **5,775,258.07** | **2,773,063.93** |

**2.4 නීතින්ට, නියමයන්ට, නියෝගයන්ට සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.**

ප්‍රසාද දීමනා වලට අදාළ උපයන විට ගෙවීම් බද්ද

අ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතට අනුව ගණනය කොට ප්‍රේෂණය කර ඇත.

ආ) ලේක්හවුස් ආයතනය 1926 වර්ෂයේ සීමාසහිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත සමාගමකි. 87% ක් වූ කොටස් 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (විශේෂ ප්‍රතිපාදන) යටතේ ජනසතු කරන ලද අතර, මෙම අයිතිය රජය වෙනුවෙන් මහා භාරකාර තැන මගින් රඳවා තබාගනු ලබයි. 1973 වසරේ සිට මේ දක්වා කිසිම විටක ලේක්හවුස් ආයතනය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව හෝ මුදල් අමාත්‍යාංශය මගින් හෝ පනවා ඇති රෙගුලාසි වලට යටත් ආයතනයක් ලෙස කටයුතු කර නොමැත. තවද රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ වලට අනුකූලව ක්‍රියාකර නොමැති අතර, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මෙම තත්ත්වය පිළිබඳව වාචිකව පිළිගෙන ඇත. ලේක්හවුස් ආයතනයේ හිටපු සභාපති රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තු චක්‍රලේඛ වලින් නිදහස් කරන ලෙස අදාළ කරුණු දක්වමින් මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති අතර, එයට අදාළ පිළිතුරු අප වෙත ලැබිය යුතුව ඇත.

ලේක්හවුස් ආයතනය කිසි විටෙකත් රජයේ මුදල් භාණ්ඩාගාරය මත රඳා පවත්වා නොමැත. ආයතනයේ ක්‍රියාකාරීත්වය හසුරුවනු ලබන මනා ලෙස පිහිටුවන ලද පිළිවෙත්, ක්‍රියාමාර්ග සහ සංයුක්ත සැලැස්මක් ලේක්හවුස් ආයතනය සතුව පවතී.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සටහන් කර ගන්නා ලදී.

### 3.2 විස්තරාත්මක මූල්‍ය සමාලෝචනය

සටහන් කර ගන්නා ලදී.

## 4. ක්‍රියාකාරීත්ව සමාලෝචනය

**4.1** 1973 අගෝස්තු මස 4 වන දින පළ කරන ලද ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් අංක 71/1 හි 1973 අංක 28 දරන සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම (විශේෂ ප්‍රතිපාදන) ව්‍යවස්ථාවෙහි ජේද අංක 2 සහ 17 හි සඳහන් පරිදි ශ්‍රී ලංකාවේ වඩාත් විශ්වාසනීය සහ නව්‍යකරණ මුද්‍රිත මාධ්‍ය සේවා සපයන්නා ලෙස ආයතනයේ දැක්ම ඉෂ්ට කිරීම සඳහා ආයතනය මූලික අරමුණු කිහිපයක් මත යොමු වී ඇත.

අ) සටහන් කර ගන්නා ලදී. සළකා බලන ලද වර්ෂය අතරතුර ආයතනය පහත සඳහන් ප්‍රධාන පුවත්පත් 6 ක් ප්‍රකාශයට පත්කර ඇත.

| | | |
|---|---|---|
| i) සන්ඩේ ඔබ්සර්වර් | ii) ඩේලි නිව්ස් | iii) දිනමිණ |
| iv) සිළුමිණ | v) තිනකරන් | vi) තිනකරන් වාරමංජරි |

# විගණන නිරීක්ෂණ පිළිබඳ සභාපතිතුමාගේ නිර්දේශ

වාර ප්‍රකාශන 9 ක් එනම්;

සතිපතා

| | | | | | |
|---|---|---|---|---|---|
| i) | තරුණී | ii) | මිහිර | iii) | සරසවිය |
| iv) | බුදුසරණ | v) | සුබසෙත | vi) | මාංචු |

මාසික

| | | | | | |
|---|---|---|---|---|---|
| vii) | වන්න වානවිල් | viii) | මිහිතුරු | ix) | දැනමුතු |

බෙදාහැරීම් ක්‍රියාවලියේ සිදුවන අව පාලනය සහ පාඩු හේතුකොට ගෙන 2015 වර්ෂයේදී කළමනාකාරිත්වය වාර ප්‍රකාශන 16 ක් අත්හිටුවා ඇත. කෙසේ වුවද 2016 වර්ෂයේදී අතිරේක පුවත්පත් ලෙස පහත සඳහන් වාර ප්‍රකාශන නිකුත් කර ඇත.

| | | | | | |
|---|---|---|---|---|---|
| i) | ක්‍රීඩා | ii) | විදුණැන | iii) | සිත්මිණ |
| iv) | ආරෝග්‍යා | v) | අතුරුමිතුරු | | |

තවද 2017 වර්ෂයේදී වාර ප්‍රකාශන 3 ක් (සිත්මිණ, ආරෝග්‍යා සහ අතුරුමිතුරු) යෝග්‍ය බෙදාහැරීම් පද්ධතියක් සමග නැවත ආරම්භ කර ඇත.

පුවත්පත් බෙදාහැරීම් වලට අදාළ වෙළඳපොළ කොටසේ ඇතිවූ බිඳ වැටීම නැවත ලබාගැනීම සඳහා ආයතනය මගින් විවිධ වූ පහත සඳහන් ක්‍රමෝපයන් හඳුන්වා දී ඇත.

i) බෙදාහැරීමේ ආදායම වැඩිදියුණු කිරීම සඳහා පුවත්පත් නියෝජිතවරුන් සහ අපගේ ප්‍රාදේශීය වාර්තාකරුවන් සමග සිදු කරනු ලබන අඛණ්ඩ ප්‍රගති සමාලෝචන රැස්වීම්

ii) ගම් නගර චාරිකා, පෝස්ටර් ක්‍රියාමාලා, රූපවාහිනී, ගුවන්විදුලි, සිනමා ශාලා වෙළඳ දැන්වීම් යනාදී මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන්

iii) බෙදාහැරීමේ දෙපාර්තමේන්තුවට අදාළ බෙදාහැරීමේ කටයුතුවල ගුණාත්වය වැඩි දියුණු කිරීම සඳහා නව තොරතුරු පද්ධතියක් හඳුන්වාදීම.

iv) ප්‍රාදේශීය විකුණුම් නිලධාරීන් ගේ කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ලෝක ව්‍යාප්ත ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS Tracking System) හඳුන්වාදීම

v) පුවත්පත් ආපසු එවුම් විමර්ශනය කිරීමේ පහසුව සඳහා කඩිනම් ප්‍රතිචාර කේතය - තීරු සංකේත ක්‍රමය හඳුන්වාදීම.

vi) පුවත්පත් නියෝජිත ආදායම ඉහළ නැංවීමේ අරමුණින් මූලික සිංහල හා දෙමළ පුවත්පත් සඳහා නියෝජිත කොමිස් මුදල් වැඩිකිරීම.

ආ) සටහන් කර ගන්නා ලදී. සමාලෝචිත වර්ෂයේදී ඉහතින් සඳහන් කළ පරිදි (බෙදා හැරීමේ ආදායම ඉහළ නැංවීම සඳහා) කළමනාකාරිත්වය විවිධ ක්‍රමෝපායන් ක්‍රියාවට නංවා ඇත. එයට අමතරව අපගේ වෙළඳපල කොටස උකහා ගැනීම සඳහා කළමනාකාරිත්වය මගින් කතෘමණ්ඩල පිරි සැලසුම්, කතෘමණ්ඩල අන්තර්ගතය සහ මුද්‍රණයේ තත්ත්වය යනාදිය වෙනස් කර ඇති අතර, කොන්ත්‍රාත් පදනම මත විද්‍යුත් මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණ වැඩසටහන් හඳුන්වා දී ඇත.

ඇ) පවත්නා සීමිත මුද්‍රණ යන්ත්‍ර මගින් මූලික වශයෙන් පුවත්පත් ආදායම් කේන්ද්‍ර කොට ගැනීම හේතුවෙන් කළමනාකාරිත්වය මගින් සමාලෝචිත වර්ෂයේද රජයේ පෙළපොත් සහ ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන නාමාවලිය මුද්‍රණය භාරගෙන නොමැත. දිගින් දිගටම පැවති පාඩු හේතුකොට ගෙන වාර්ෂික ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ කටයුතු අත්හිටුවා ඇත.

විමසුමේ සඳහන් වටිනාකමින් පවත්නා ආදායම අවම වී තිබුණද කළමනාකාරිත්වය මෙම තීරණ 2 ක්‍රියාත්මක කර ඇත්තේ පුවත්පත් මුද්‍රණ කර්මාන්තයේ වෙළඳපල කොටස ඉහළ නැංවීමේ දිගුකාලීන අරමුණෙනි.

ඈ) පිළිගනිමි. දැන්වීම් ගාස්තු ඉහළ නැංවීමට අමතරව කරන ලද වර්ෂ අවසාන දැන්වීම් නියෝජිත දිරි දීමනා, විකුණුම් කළමනාකරුවන්ගේ දිරි දීමනා සහ පළ කරන ලද දැන්වීම් ප්‍රමාණයේ වර්ධනය යනාදියද සමස්ථ දැන්වීම් ආදායමේ වර්ධනයට ඉවහල් විය.

ඉ) අමතර ඉඩකඩ කුලියට දී ආදායම් ඉපයීමේ ප්‍රතිපත්තියක් ආයතනය සතුව පවත්නා අතර, එම ආදායම් ලැබීම් වෙනත් ආදායම් ලෙස සළකනු ලැබේ. මෙවැනි කුලී ආදායමක් ආයතනයේ ස්ථිර ආදායම් මාර්ගයක් වන බැවින් ආයතනය ඉදිරියේදී ද අමතර ඉඩකඩ කුලියට දීමට අදහස් කර ගෙන සිටී.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

අ) ඔබ විසින් සඳහන් කළ පරිදි රුපියල් මිලියන 49.8 ක් වූ දැන්වීම් 2013 මාර්තු මසට 2016 ජනවාරි මස දක්වා මෙම සඟරාවල ඇතුළත්ව ඇති අතර, එයින් රුපියල් මිලියන 34.3 ක් අයකර ගෙන ඇති අතර, ශේෂය රුපියල් මිලියන 15.4 කි.

සඟරාව ප්‍රචලිත කිරීමට අමතරව සභාපති තුමා සමග සාකච්ඡා කළ පරිදි දැන්වීම්කරුවන් යොදවා ගැනීම සහ රඳවා ගැනීම සඳහා බිස්නස් LK දැන්වීම් පළකරන්නන්හට දැන්වීම් ප්‍රවර්ධනය කිරීම සඳහා ඉඩකඩ ලබාදීමට තීරණ කරන ලදි.

සඟරාව සමග දැන්වීම් පවත්වා ගැනීම සඳහා මෙම ඉඩකඩ දැන්වීම්කරුවන් සඳහා කරනු ලබන දිරි දීමනාවක් ලෙස නොමිලයේ ලබදීමට සැලසුම් කලද වැරදීමකින් මෙම දැන්වීම් වෙනුවෙන් මුදල් අයකර ගෙන ඇත.

එම නිසා ඉතිරි හිඟ මුදල් ප්‍රවර්ධන පදනම මත දැන්වීම්කරුවන් වෙත නොමිලයේ ලබා දුන් අතර, එම මුදල් නැවත එකතු කර ගැනීමක් හෝ අයකර ගැනීමක් සිදු නොවන බව අප දන්වා සිටිමු.

ආ) සටහන් කර ගන්නා ලදී.

ඇ) සටහන් කර ගන්නා ලදී.

ඈ) කරුණාකර අගරු වූ චෙක්පත් ලැයිස්තුව වෙත යොමු වන්න. 2009 වසරේ සිට 2016 වර්ෂය දක්වා අගරු වූ චෙක්පත් වල වටිනාකම රුපියල් 10,585,138.02 කි. රුපියල් 2,501.495.47 ක වටිනාකමින් යුත් අගරු වූ චෙක්පත් 31 ක් සඳහා ලේක්හවුස් ආයතනය නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, එම වටිනාකම මුළු අගරුවූ චෙක්පත් වටිනාකමින් 24% ක් විය.

ඉ) සටහන් කර ගතිමි.

### 4.3 විවාදශීලී ගනුදෙනු

කලින් සිදු කරනු ලබන පියවීම් සඳහා පොලී ඉදිරිපත් කිරීම පුවත්පත් කර්මාන්තයේ සිදු කරනු ලබන පොදු ක්‍රියා පිළිවෙතක් වේ. මෙවැනි කලින් සිදු කරනු ලබන පියවීම් සඳහා ලේක්හවුස් ආයතනය පුවත්පත් නියෝජිතයන් හට දෙනු ලබන්නේ එක් විකල්පයක් පමණි. කෙසේ නමුත් අනෙකුත් තරගකාරී පුවත්පත් ආයතන පුවත්පත් නියෝජිතයෝ හට විකල්ප කිහිපයක් තෝරා ගැනීමට අවස්ථාව ලබා දී ඇත.

කලින් සිදු කරනු ලබන පියවීම් වලට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය දෙපාර්තමේන්තුවෙහි නොමැත. 2016 වර්ෂයේ දී රුපියල් මිලියන 2.9 ක් වූ පොලී මුදලක් කලින් සිදු කරනු ලබන පියවීම් සඳහා ගෙවා ඇත.

### 4.4 අකර්මණ්‍ය හෝ ඌණ උපයෝජනය කරන ලද වත්කම්

එකඟ වේ. හෝකන්දර ඉඩමෙහි අයිතිය 2013 වර්ෂයේදී ලේක්හවුස් ආයතනයට පවරනලද අතර, ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ ක්‍රමය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් ණය ලබා ගැනීම සඳහා කොමර්ෂල් බැංකුව වෙත උකස්කරන ලදී.

### 4.5 හඳුනාගත් අලාභ

නැව්ගත භාණ්ඩ ප්‍රමාද වීම් හේතුකොට ගෙන නිසි වේලාවට මුද්‍රණ කටයුතු සඳහා නිසි කලට අමුද්‍රව්‍ය ආයතනය වෙත ළඟා වී නොමැත. මේ නිසා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත මුද්‍රණය නිම කළ අදාළ පෙල පොත් යොමු කිරීමේදී යම් යම් ප්‍රමාද වීම් සිදු විය.

**4.6 ආයතනයේ මානව සම්පත් වෙනත් ආයතන වලට මුදා හැරීම.**

කළමනාකාරිත්වයේ අනුමැතිය පරිදි රජයේ ආයතන වෙනුවෙන් සේවය කිරීම සඳහා පත්‍ර කලාවේදීන් දෙදෙනෙකු මුදා හැර ඇත. ව්‍යාපාරික අවශ්‍යතා අනුව කළමනාකාරිත්වයේ අනුමැතිය පරිදි පත්‍ර කලාවේදීන් 6 දෙනෙකු අප විසින් බඳවා ගෙන ඇත.

**4.7 සේවක පරිපාලනය**

ආ) අප දැනටමත් මානව සම්පත් වලට අදාළ ප්‍රතිපත්ති 7 ක් අවසන් කර ඇත.

ආ) මානව සම්පත් උපදේශකයාගේ සහය ඇතිව පහත සඳහන් මානව සම්පත් ක්‍රියාවට නංවන ලද අතර, එහි ඇගයීම් අදාළ ප්‍රතිඵල ක්‍රියාකාරකම් සම්පූර්ණ වීම මත පදනම් විය.

- 2016 සහ 2017 වර්ෂවලට අදාළ KPI - ප්‍රධාන කාර්ය සාධන මැනුම් දර්ශකයන් සියලුම සේවකයන් හට හඳුන්වා දෙන ලදී.
- මානව සම්පත් ප්‍රතිපත්ති 6 ක් අවසන් කිරීම.
- නව කාර්ය සාධක පරීක්ෂණ පද්ධතිය සහ යටත් නිලධාරීන් වෙත ඵලදායී ලෙස ප්‍රතිචාර දක්වන ආකාරය පිළිබඳව අධීක්ෂකවරුන් පුහුණු කිරීම.
- මානව සම්පත් නැවත ව්‍යුහගත කිරීම.
- ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් කිහිප දෙනෙකු ගේ කාර්ය විස්තරය සකස් කොට අවසාන කිරීම.
- නව වාර්ෂික කාර්ය ඵල ඇගයීම් ක්‍රියා පිළිවෙළ අනුව වාර්ෂික පූර්ණ කාර්ය සාධන සමාලෝචන චක්‍රය, සේවය උසස් කිරීමේ චක්‍රය, වාර්ෂික වැටුප් වර්ධක චක්‍රය යනාදිය සිදු කිරීම.
- මහජන සම්බන්ධතා දුක් ගැනවිලි හැසිරවීමේ ක්‍රියාවලිය පැවැත්වීම.
- යෝජිත අභ්‍යාසලාභී වැඩසටහන් සැලසුම් කිරීම.
- බාහිර සමීක්ෂණ ආයතනයක් (LMRB) මගින් සේවක සහභාගීත්ව සමීක්ෂණයක් සිදු කිරීම.

ඇ) කාර්ය විස්තර සහ වැටුප් සමීක්ෂණයක් පිළියෙල කිරීම සඳහා ආයතන 3 කින් මිල කැඳවුම් ලබා ගන්නා ලදී. අදාළ අධ්‍යක්ෂක මණ්ඩල පත්‍ර අධ්‍යක්ෂක මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, අනුමැතිය අපේක්ෂාවෙන් සිටී.

පුහුණු හා සංවර්ධන විමසුම වෙත යොමු වන්න. සඳහන් කර ඇති සියලුම විස්තර පුහුණු හා සංවර්ධන අංශය මගින් පවත්වාගෙන යනු ලැබේ. අවශ්‍යතාවය මත අදාළ විස්තර සපයා දීමට හැකියාව ඇත.

ඈ) මෙම බඳවා ගැනීම් කළමනාකාරිත්වයේ දැනුමැති සහ ව්‍යාපාරික අවශ්‍යතා මත සිදු කරන ලදී. (කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් කළ නොහැකි තනතුරු කිහිපයක් සඳහා ස්ථිර පදනම මත විශේෂිත වූ එම තනතුරු සඳහා 05 දෙනෙකු බඳවා ගන්නා ලදී.

**5. ගිණුම් කටයුතු භාවය සහ යහ පාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

ඉහත සඳහන් කරුණ පිළිබඳ ඔබගේ අදහස් ඉතාමත් අපැහැදිලි වේ. කෙසේ නමුත් 2013 - 2016 වර්ෂයන් වෙනුවෙන් සංයුක්ත සැලැස්මක් පවතින බව අප තහවුරු කරන්නෙමු.

අප හට අවබෝධ වී ඇති පරිදි ඔබ විසින් යොමු කරන ලද පවත්නා සම්පත් අප විසින් වාර්තාවේ පැහැදිලි ලෙස දක්වා ඇති පරිදි ශක්තීන් ලෙස දක්වා ඇත. ඔබ විසින් යොමු කර ඇති පූර්ව වර්ෂ 3 ක ප්‍රතිඵල සහ සැලැස්ම පූර්ණ ලෙස විග්‍රහ කර ඇති අතර, එම ප්‍රතිඵල ආයතනය වෙනුවෙන් උපාය මාර්ග පිළියෙල කිරීමේදී යොදාගන්නා ලදී.

**5.2 වාර්ෂික කාර්යය සැලැස්ම -**

අප මෙම සාමාන්‍ය අර්ථ කථනය හා එකඟ නොවෙමු.

සමාලෝචිත වර්ෂය තුළදී සතිපතා පැවැත්වෙන ක්‍රියාකාරිත්ව සමාලෝචන රැස්වීම මගින් සමාලෝචිත වර්ෂය තුළදී සියලුම කාර්යයන් දැඩි ලෙස හැසිරවීමේ ක්‍රියාවලියක් අප විසින් ක්‍රියාත්මක කරන ලදී. නියමිත දිනයන්ට පෙර අදාළ සියලුම කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා පෙළ ගැස්වූ අතර, අදාළ කාර්යයන් හි ප්‍රගතිය පුළුල් ලෙස හසුරුවන ලදී.

# විගණන නිරීක්ෂණ පිළිබඳ සභාපතිතුමාගේ නිර්දේශ

මෙය ආදායමෙහි විශාල වර්ධනයක් සඳහා ඉවහල් වූ අතර, සමාජ මාධ්‍ය සහ ඩිජිටල් මාධ්‍ය අංශවලට අදාළව සම්මාන රැසක්ම ලබා ගැනීමටද අනුබලයක් විය. විශාල මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගන්නවා වෙනුවට දැනට පවත්නා සියලුම මුද්‍රණ යන්ත්‍ර වෙළඳපල අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩිදියුණු කරන ලදී. සමාලෝචිත වර්ෂය මානව සම්පත් ක්‍රියාවලියට අදාළ කටයුතු දියත් කිරීම සඳහා ස්වර්ණමය වසරක් වූ අතර, ප්‍රතිපත්ති, ක්‍රියා පිළිවෙත්, තොරතුරු තාක්ෂණික පද්ධති සහ විශිෂ්ඨ භාවිතයන් රාශියක් අප විසින් අත්පත් කර ගන්නා ලදී.

**5.3 විගණන කමිටු**

සටහන් කර ගන්නා ලදී.

**5.4 අයවැය පාලනය**

අ) කරුණාකර 2.4 (ආ) සඳහා අදාළ පිළිතුරු වෙත යොමුවන්න.

ආ) සටහන් කර ගතිමි

**5.5 නොවිසිඳුණු විගණනය**

අ) i) සටහන් කර ගතිමි.

ii) 2016 දෙසැම්බර් 31 දිනට ණයහැති ලෙජරයේ ශේෂයන් සහ හොල් පෝටර් සහ පාසල් සඳහා බෙදාහැරීම් වලට අදාළ ණයගැති වයස් විශ්ලේෂණයෙහි ශේෂයන් හි ඇතුළත් වාර්තා කාලානුරූපී වෙනස්කම් හේතු කොට ගෙන නොසැසඳුනි. මෙම වෙනස්කම් සඳහා අදාළ සැසඳීම් ඒ සමගම සිදු කර ඇත.

iii) විකුණුම් වර්ධනය කිරීමේ අරමුණින් කළමනාකාරිත්වය පුවත්පතෙහි සැලැස්ම සහ අන්තර්ගතය වෙනස් කිරීමට තීරණය කර ඇත.

**6. පද්ධති සහ පාලනයන්**

අ) එකඟ නොවේ. ණය ගැතියන් ශේෂයන් අදාළ ණයගැතියන් මගින් තහවුරු කිරීමක් සිදු නොවුවද 2016 දෙසැම්බර් 31 දිනට හිඟව තිබෙන ශේෂ බහුතරයක් 30.06.2017 දින වන විට පියවා ඇත.

ආ) ඉහත 2.2.2.3 (ඇ) හි සඳහන් පරිදි වේ.

ඇ) වර්තමානයේදී පුවත්වත් විකුණුම් ආදායම ඉතා සියුම් ලෙස පරීක්ෂාවට භාජනය වන අතර, අනාගතයේදී තත්ත්වය වඩාත් ශක්තිමත් කිරීම සඳහා අදාළ ක්‍රියාමාර්ග ගනු ඇත.

ඈ) පුහුණු කිරීම්වලට අදාළ කාලසටහන පිළියෙල කොට අවසන් කරනලද අතර, එම කාලසටහනට අනුකූලව අදාළ පුහුණු කිරීම් සිදු කරනු ලබයි. ලේක්හවුස් ආයතනයේ සේවකයින්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා ඉගෙනුම හා සංවර්ධන අංශය ආයෝජනයකර හා බාහිර පුහුණු වැඩසටහන් පවත්වනු ලබයි.

කුසලතා අත්පත් කර ගැනීම් වලට අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළියෙල කොට අවසන් කර ඇත. අදාළ නියමන් සහ කොන්දේසි මානව සම්පත් උපදේශකයන් මගින් පිළියෙල කොට අවසන් කළ අතර, එහි ප්‍රතිඵල වාර්ෂික KPI ක්‍රියාවලිය, වාර්ෂික උස්සවීම් චක්‍රය, සේවක දුක්ගැනවිලි හැසිරවීමේ ක්‍රියාවලිය සහ සහභාගිත්ව සමීක්ෂණය යනාදිය මගින් මනින ලදී.

ඉ) කරුණාකර 2.2.2.1 (ඊ) ට අදාළ පිළිතුරු වෙත යොමු වන්න.



**ක්‍රිෂාන්ත කුරේ**
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂක.

# මානව සම්පත්

ආයතනයේ ශ්‍රම බලකාය අප ආයතනයේ වැදගත්ම අංශය වශයෙන් පිළිගෙන ඇති අතර, සමාගම විසින් සමාගමේ උන්නතිය වෙනුවෙන් උරදෙන සේවකයන් හඳුනාගැනීමට මානව සම්පත නිරන්තර ඇගයීමකට ලක් කරනු ලබයි. ආයතනික උපක්‍රමශීලී අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදහස ඇතිව මානව සම්පත් ඒ උදෙසා පෙළගස්වමින් සේවක ආරක්ෂණය රඳවා ගැනීම සහ හැකියාවන් වර්ධනය කරගැනීම වෙනුවෙන් සේවක සුබසාධක පහසුකම්ද වැඩිදියුණු කරන ලදී.

**ස්ත්‍රී පුරුෂ භේදය** (දෙසැම්බර් 31 දිනට)

| ස්ත්‍රී පුරුෂ භාවය | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| පුරුෂ | 1,191 | 78% | 1,387 | 80% |
| ස්ත්‍රී | 330 | 22% | 356 | 20% |
| **එකතුව** | **1,521** | **100%** | **1,743** | **100%** |







## සේවා කාල විශ්ලේෂණය

### සේවකයන්ගේ සාමාන්‍ය සේවා කාලය

| සේවා කාලය | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| අවුරුදු 25 ට වැඩි | 177 | 12% | 209 | 12% |
| 20 - 25 | 199 | 13% | 250 | 14% |
| 5 - 20 | 875 | 58% | 1,041 | 60% |
| අවුරුදු 5 ට අඩු | 270 | 17% | 243 | 14% |
| **එකතුව** | **1,521** | **100%** | **1,743** | **100%** |







## වයස් විශ්ලේෂණය

| වයස | 2016 | | 2015 | |
|---|---|---|---|---|
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 50 ට වැඩි | 363 | 24% | 412 | 24% |
| 40-50 | 569 | 37% | 660 | 38% |
| 30-40 | 500 | 33% | 586 | 33% |
| 20-30 | 89 | 6% | 85 | 5% |
| **එකතුව** | **1,521** | **100%** | **1,743** | **100%** |






# විස්තරාත්මක ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | සමාගම | | සමූහය | |
|---|---|---|---|---|---|
| | | 2016<br>රු. '000 | 2015<br>රු. '000<br>නැවත<br>ප්‍රකාශ කළ | 2016<br>රු. '000 | 2015<br>රු. '000<br>නැවත<br>ප්‍රකාශ කළ |
| ආදායම | 21 | 3,046,881 | 2,945,218 | 3,050,156 | 2,954,438 |
| විකුණුම් පිරිවැය | | (1,411,135) | (1,378,305) | (1,412,381) | (1,384,816) |
| දළ ලාභය | | 1,635,746 | 1,566,913 | 1,637,775 | 1,569,622 |
| වෙනත් ආදායම් | 22 | 121,844 | 124,182 | 122,264 | 124,474 |
| | | 1,757,590 | 1,691,095 | 1,760,039 | 1,694,096 |
| පරිපාලන වියදම් | | (1,172,608) | (1,279,053) | (1,183,375) | (1,286,149) |
| බෙදාහැරීමේ වියදම් | | (330,909) | (327,051) | (334,205) | (333,240) |
| මෙහෙයුම් ලාභය | 23 | 254,073 | 84,991 | 242,459 | 74,706 |
| මූල්‍ය වියදම් | | (49,929) | (58,879) | (49,938) | (58,502) |
| ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමට පෙර ලාභය | | 204,144 | 26,111 | 192,521 | 16,204 |
| ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාමේ වියදම් | 24 | (163,513) | - | (163,513) | - |
| බදු හා සාධාරණ අගය ගැලපීමට පෙර ලාභය | | 40,631 | 26,111 | 29,008 | 16,204 |
| බදු වියදම | 26 | (8,392) | (4,688) | (8,515) | (4,956) |
| සාධාරණ අගය ගැලපීම | | 115 | 28,690 | 115 | 28,690 |
| **වසරේ ලාභය** | | **32,354** | **50,113** | **20,608** | **39,938** |
| **ආරෝපිත ලාභය මුල් හිමිකරුවන්ට** | | **32,354** | **50,113** | **20,608** | **39,938** |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන් | ආයතනය 2016 රු. '000 | ආයතනය 2015 රු. '000 නැවත ප්‍රකාශ කළ | ආයතනය 2014 රු. '000 නැවත ප්‍රකාශ කළ | සමූහය 2016 රු. '000 | සමූහය 2015 රු. '000 නැවත ප්‍රකාශ කළ | සමූහය 2014 රු. '000 නැවත ප්‍රකාශ කළ |
|---|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 06 | 357,877 | 251,856 | 326,266 | 358,159 | 252,535 | 327,471 |
| ආයෝජන වත්කම් | 07 | 29,800 | 31,455 | - | 29,800 | 31,455 | - |
| දිගුකාලීන මූල්‍ය වත්කම් | 08 | 180,056 | 179,941 | 151,251 | 180,056 | 179,941 | 151,251 |
| ඒකාබද්ධයන්හි ආයෝජන | 09 | 13,000 | 13,000 | 13,000 | - | - | - |
| විලම්බිත බදු වත්කම් | 10 | 32,025 | 36,967 | 30,888 | 32,020 | 36,967 | 30,888 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **612,758** | **513,219** | **521,405** | **600,035** | **500,898** | **509,610** |
| **ජංගම වත්කම්** | | | | | | | |
| තොග | 11 | 327,509 | 273,882 | 532,233 | 327,509 | 273,882 | 532,233 |
| වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 12 | 880,043 | 907,494 | 951,226 | 874,522 | 909,378 | 948,800 |
| ජංගම බදු වත්කම් | 26 | 9,169 | - | 3,322 | 9,169 | - | 3,296 |
| මුදල් හා මුදලට සමාන වත්කම් | 13 | 109,106 | 14,592 | 74,613 | 109,672 | 14,703 | 89,021 |
| **මුළු ජංගම වත්කම්** | | **1,325,827** | **1,195,968** | **1,561,394** | **1,320,873** | **1,197,963** | **1,573,350** |
| **මුළු වත්කම්** | | **1,938,585** | **1,709,187** | **2,082,799** | **1,920,908** | **1,698,861** | **2,082,960** |
| **හිමිකම් හා වගකීම්** | | | | | | | |
| **හිමිකම්** | | | | | | | |
| අනුදත් ප්‍රාග්ධනය | 14 | 34,837 | 34,837 | 34,837 | 34,837 | 34,837 | 34,837 |
| රඳවාගත් ආදායම | | 522,752 | 490,398 | 440,285 | 507,551 | 482,447 | 442,509 |
| **මුළු සාමාන්‍ය කොටස්** | | **557,589** | **525,235** | **475,122** | **542,388** | **517,284** | **477,346** |
| **වගකීම්** | | | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | |
| තැන්පතු | 15 | 171,159 | 173,464 | 173,815 | 171,159 | 173,464 | 173,815 |
| ණය | 16 | 244,655 | 73,784 | 143,805 | 243,155 | 70,284 | 140,305 |
| බදු ණය හිමියෝ | 17 | - | 1,348 | 2,634 | - | 1,348 | 2,635 |
| සේවක ප්‍රතිලාභ බැඳියාව | 20 | 318,298 | 332,675 | 322,093 | 318,298 | 332,675 | 322,093 |
| ආයතනයට එරෙහි නඩු සඳහා වෙන්කිරීම් | 18 | 20,000 | 19,250 | 20,000 | 20,000 | 19,250 | 20,000 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **756,112** | **600,521** | **662,347** | **752,612** | **597,021** | **658,848** |
| **ජංගම වගකීම්** | | | | | | | |
| ණය | 16 | 277,179 | 287,955 | 509,376 | 277,179 | 287,957 | 509,378 |
| බදු ණය හිමියෝ | 17 | 1,349 | 1,286 | 4,205 | 1,349 | 1,286 | 4,205 |
| වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 19 | 346,356 | 294,190 | 431,749 | 347,380 | 295,313 | 433,183 |
| **මුළු ජංගම වගකීම්** | | **624,884** | **583,431** | **945,330** | **625,908** | **584,556** | **946,766** |
| **මුළු වගකීම්** | | **1,380,996** | **1,183,952** | **1,607,677** | **1,378,520** | **1,181,577** | **1,605,614** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **1,938,585** | **1,709,187** | **2,082,799** | **1,920,908** | **1,698,861** | **2,082,960** |

මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල ඇති සියලුම කොටස් මනාව හැඩගස්වා ඇත.
මෙම මූල්‍ය ප්‍රකාශන 2007 සමාගම් පනතේ අංක 07 අවශ්‍යතාවයන්ට අනුකූලවන පරිදි සකස්කර ඇති බවට සහතික කරමි.

**විරාජිත් බොයිස්** - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මූල්‍ය

අධ්‍යක්ෂක මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව වගකියනු ලැබේ.
අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අනුමතකර අත්සන් තබන ලදී.

**කාවන් රත්නායක**
සභාපති සහ කළමනාකාර අධ්‍යක්ෂක
2017 මාර්තු 20 දින,
කොළඹ.

**එමරික් ප්‍රනාන්දු**
මුදල් අධ්‍යක්ෂක

# අරමුදල් ප්‍රවාහ ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | සමාගම 2016 රු. '000 | සමාගම 2015 රු. '000 | සමූහය 2016 රු. '000 | සමූහය 2015 රු. '000 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු** | | | | | |
| මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් | 27 | 221,422 | 328,446 | 221,796 | 313,600 |
| පොලී ගෙවීම් | | (49,929) | (58,879) | (49,938) | (58,502) |
| ආදායම් බදු ගෙවීම් | | (17,039) | (3,026) | (17,215) | (3,145) |
| පාරිතෝෂික ගෙවීම් | | (88,389) | (38,042) | (88,389) | (38,042) |
| ආයතනයට එරෙහිව පවරා ඇති නඩු වෙනුවෙන් ගෙවීම් | | (900) | (12,209) | (900) | (12,209) |
| මෙහෙයුම් කටයුතු වලින් ලද මුදල් ප්‍රවාහය | | 65,166 | 216,291 | 65,355 | 201,702 |
| **ආයෝජන කටයුතු** | | | | | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (188,569) | (59,180) | (188,719) | (59,180) |
| දේපල පිරියත හා උපකරණ විකිණීම | | 12,698 | 11,382 | 12,698 | 11,382 |
| තැන්පතු වල වැඩිවීම / (අඩුවීම) | | (2,306) | (351) | (2,305) | (351) |
| ලද පොලිය | | 9,838 | 11,868 | 10,258 | 12,160 |
| ලද ලාභාංශ | | 3,486 | 2,254 | 3,486 | 2,254 |
| ලද කුලී ආදායම | | 33,390 | 33,760 | 33,390 | 33,760 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ (වැඩිවීම) / අඩුවීම | | - | 19,603 | - | 19,603 |
| ආයෝජන කටයුතු වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය | | (131,462) | 19,336 | (131,193) | 19,627 |
| **මූල්‍ය කටයුතු** | | | | | |
| ණයගැනීම්වල වැඩිවීම / (අඩුවීම) | | 263,176 | (332,526) | 263,176 | (332,526) |
| මූල්‍ය කටයුතු තුළින් මුදල් ප්‍රවාහය | | 263,176 | (332,526) | 263,176 | (332,526) |
| **මුදල් හා මුදලට සමාන වත්කම් වල ශුද්ධ වෙනස** | | **196,880** | **(96,899)** | **197,338** | **(111,196)** |
| **ජනවාරි 01 දින දී මුදල් හා මුදලට සමාන වත්කම්** | | **(179,776)** | **(82,877)** | **(179,668)** | **(68,472)** |
| **දෙසැ. 31 දින දී මුදල් හා මුදලට සමාන වත්කම්** | **13** | **17,104** | **(179,776)** | **17,670** | **(179,668)** |

# හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

**සමාගම**

| | කොටස් ප්‍රාග්ධනය<br>රු. '000 | රඳවාගත් ඉපයීම්<br>රු. '000<br>(නැවත ප්‍රකාශ කළ) | එකතුව<br>රු. '000 |
|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 34,837 | 409,397 | 444,234 |
| නැවත ප්‍රකාශය වෙනස් කිරීමේ බලපෑම | | 30,888 | 30,888 |
| 2015.01.01 දිනට ශේෂය (නැවත ප්‍රකාශය) | 34,837 | 440,285 | 475,122 |
| 2015 වර්ෂය සඳහා ලාභය | | 50,113 | 50,113 |
| 2015.12.31 දිනට ශේෂය | 34,837 | 490,398 | 525,235 |
| 2016 වර්ෂය සඳහා ලාභය | | 32,354 | 32,354 |
| 2016.12.31 දිනට ශේෂය | 34,837 | 522,752 | 557,589 |

**සමූහය**

| | කොටස් ප්‍රාග්ධනය<br>රු. '000 | රඳවාගත් ඉපයීම්<br>රු. '000 | එකතුව<br>රු. '000 |
|---|---|---|---|
| 2015.01.01 දිනට ශේෂය | 34,837 | 411,621 | 446,458 |
| නැවත ප්‍රකාශය වෙනස් කිරීමේ බලපෑම | | 30,888 | 30,888 |
| 2015.12.31 දිනට ශේෂය (නැවත ප්‍රකාශය) | 34,837 | 442,509 | 477,346 |
| 2015 වර්ෂය සඳහා ලාභය | | 39,938 | 39,938 |
| 2015.12.31 දිනට ශේෂය | 34,837 | 482,447 | 517,284 |
| ජංගම ගිණුම | | 4,496 | 4,496 |
| 2016 වර්ෂය සඳහා ලාභය | | 20,608 | 20,608 |
| 2016.12.31 දිනට ශේෂය | 34,837 | 507,551 | 542,388 |

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

## 1. ආයතනික තොරතුරු

### 1.1 පොදු

ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්තිපත්‍ර සමාගම වනාහි සීමිත වගකීමෙන් යුත් සමාගමක් වන අතර, එහි නිත්‍ය වාසස්ථානය ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. ලියාපදිංචි කාර්යාලය කොළඹ 10, ඩී. ආර්. විජේවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථාන හා ලිපිනය පහත දැක්වෙන පරිදි වේ.

1. මහනුවර ශාඛාව : අංක 22, දළදා වීදිය, මහනුවර.
2. කතරගම ශාඛාව: ශ්‍රී රේවත මාවත, කතරගම.
3. මාතර ශාඛාව : අංක 29, 30, 31, නව මගී බස් නැවතුම්පළ සාප්පු සංකීර්ණය.
4. අනුරාධපුර ශාඛාව : හරිස්චන්ද්‍ර මාවත, නව නගරය, අනුරාධපුර.
5. යාපනය ශාඛාව : අංක 364, කේ. කේ. එස්. පාර, යාපනය.

2016 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන්වූ වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ වලට මව් සමාගම සහ එහි අනුබද්ධ (පරිපාලිත) ආයතන අන්තර්ගත වනු ඇත. (මින් මතුව පොදුවේ "සමූහය" ලෙස හදුන්වනු ලැබේ)

### 1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

**මව් සමාගම**

මූල්‍ය වර්ෂය තුලදී සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ පුවත්පත්, වාර ප්‍රකාශන, සඟරා යනාදිය මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීමත් සහ වාණිජ මුද්‍රණ කටයුතුවල නිරත වීමත්ය. සමාගම සතුව, ආයතනික මූලස්ථානය හා මුද්‍රණ යන්ත්‍රාගාර / පිරියත හෙවත් මුද්‍රණාලය කොළඹ පිහිටා ඇති අතර, අලෙවි හෙවත් විකුණුම් කටයුතු ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාව තුලම සිදු කරනු ලැබේ.

**පරිපාලන ආයතන :**

වර්ෂය තුළ මෙකී පරිපාලිත සමාගම් වල ප්‍රධානතම කාර්යය කටයුතු පහත දක්වා ඇති අයුරින් සිදුකරනු ලැබ ඇත.

(අ) **ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගම** සමාගම විසින් එහි පූර්ණ හිමිකාරිත්වය දරන අනුබද්ධ හෙවත් පරිපාලිත සමාගම ලේක් හවුස් ප්‍රොපර්ටි ඩිවෙලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් නොහොත් සීමාසහිත ලේක්හවුස් දේපල සංවර්ධන (පෞද්ගලික) සමාගම යන නාමයෙන් යුක්තව 1985 දී දේපල සංවර්ධන ව්‍යාපාර කටයුතු කලට විවිධාංගිකරණය කිරීමේ අරමුණින් හා අදහසින් යුක්තව ස්ථාපනය කරනු ලැබූ නමුත් තවමත් එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සිදු කර නොමැත.

(ආ) **ඔබ්සර්වර් ජොබ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (කලින් ඉන්ෆෝ මීඩියා ප්‍රයිවට් ලිමිටඩ්** යනුවෙන් හඳුන්වන ලද) 2012 වර්ෂය තුළදී සමාගම විසින් (මුළුමනින්ම එයට අයත් දෙවන පූර්ණ අනුබද්ධිත හෙවත් පරිපාලිත සමාගම ලෙස ඉන්ෆෝ මීඩියා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම යන නමින් දීප ව්‍යාප්තව, සීඝ්‍රතම තොරතුරු හා දැනුම සපයන්නා හෙවත් ලබාදෙන්නා ලෙසට වර්ධනය වීමේ, සමාගම් සමූහයේ මූලෝපාය හෝ උපාය මාර්ගය ලෙසින් ඒ අනුපාතයට යාපනයහි දෙමළ භාෂාමය පුවත්පත් මුද්‍රණය කරලීම අරමුණින් පිහිටුවා ලන්නට යෙදුනි. 2016 වර්ෂය තුලදී, සමාගම විසින් එහි නාමය, දේශීයව හා අන්තර්ජාතිකව, ආයතන හා සමාගම් / සංවිධානය හා අයවළුන් / පුද්ගලයන් සඳහා ව්‍යාපාරික හා මානව සම්පත් (HR) සේවාවන් ඉටුකිරීම හා පවත්වා ගෙන යාම සඳහා ඔබ්සර්වර් ජොබ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කිරීම සිදු කරනු ලැබීය.

(ඇ) **ලේක් හවුස් කනෙක්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් (මින් පෙර බිස්නස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්** යනුවෙන් හඳුන්වනු ලැබූ) තවත් එක් සමාගමට අයත් පූර්ණ වශයෙන් අනුබද්ධිත පරිපාලිත සමාගමක් වශයෙන් බිස්නස් ලංකා AN (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, ව්‍යාපාරික සඟරා කර්මාන්තයට පිවිසීමේ විවිධාංගීය කරණයට එලඹීම සඳහා වන ඉලක්කයන් හා අරමුණනින් යුක්තව 2012 වර්ෂය තුලදී ස්ථාපිත කරලන්නට යෙදුනි. 2016 වර්ෂය කාලය තුළ සමාගම විසින් එම අනුබද්ධිත සමාගමේ නාමය ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ (ANCL) හි සහ බාහිර හෙවත් පිටස්තර සමාගම්වලදී අභ්‍යන්තර හා බාහිරමය උත්සව, සිද්ධි සිදුවීම් ආදිය සංවිධානය කරලීමේ ව්‍යාපාරය පවත්වා ගෙන යාම හා මෙහෙයවීම සඳහා වන අරමුණින් යුක්තව ලේක්හවුස් කනෙක්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් යනුවෙන් වෙනස් කරන ලදි.

## 2. ඉදිරිපත් කිරීමේ පදනම

මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධයේ වෙනස්වීම හෙවත් විචලනය පිළිබඳ ප්‍රකාශය, සහ මූල්‍ය ප්‍රවාහයන් පිළිබඳ ප්‍රකාශය, ඇතුලත් සමාගම් සමූහයේ 2016 දෙසැම්බර් 31 ට, ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් සමග, (එනම් මූල්‍යමය ප්‍රකාශයන්), සහිත, 2016 දෙසැම්බර් මස 31 වන දිනට සහ එකී එදින අවසන් වන වර්ෂය සඳහා සමූහයේ

# මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

මූල්‍යමය තත්ත්වයන් හා තොරතුරු ඇතුලත් "මූල්‍ය ප්‍රකාශ" ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ (ICASL) විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමානයේ ව්‍යාපාර තත්ත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන් හා තත්ත්වයන්ට අනුකූලව පිළියෙල කර ඇත. (මින්මතු "SME" සඳහා SLFRS යනුවෙන් හඳුන්වනු ලැබේ).

මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර, සියලුම ශ්‍රී ලංකා රුපියල් මගින් ඉදිරිපත් කරන ලද මූල්‍යමය තොරතුරු ආසන්නතම දහසට දක්වා ඇත.

**2.1.1. අනුකූල වීමේ ප්‍රකාශය**

සමාගම් සමූහයේ, ඒකාබද්ධිත මූල්‍ය ප්‍රකාශ, "කුඩා හා මධ්‍යම ව්‍යවසායයන්" සඳහා වන "ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රකාශය" (SLFRS for SMES) වලට අනුගතව හා අනුකූලව පිළියෙළ කරනු ලැබ ඇත. මෙකී මූල්‍යමය ප්‍රකාශයන් 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව පිලියෙල කොට ඉදිරිපත් කර ඇත.

**2.1.2 දිගින් දිගටම පැවැතීම**

අධ්‍යක්ෂකවරුන් විසින් සාර්ථක ප්‍රවර්තන ව්‍යාපාරයක් ලෙස ආයතන සමූහය, අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා එයට ඇති හැකියාව තක්සේරුවක් හෙවත් අගැයීමක් කර ඇති අතර, ආයතනය අවසානය හෙවත් ඇවර කරනු ලැබීමට හෝ වෙළෙඳ කටයුතු අත්හිටුවීමට හෝ නතර කිරීමට අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අදහස් කර නොමැත.

## 3. ඒකාබද්ද කිරීමේ පදනම

ඒකාබද්ධ කළ මූල්‍ය ප්‍රකාශනවලට 2016 දෙසැම්බර් මස 31 වන දිනට සමාගම් සමූහයේ හා එහි අනුබද්ධිත සමාගම් වල මූල්‍යමය ප්‍රකාශ අන්තර්ගතව ඇත.

අනුබද්ධ පරිපාලිත සමාගම්, සමාගම පාලනය ලබාගත් දින සිට එනම් සංස්ථාපනය හෙවත් ඒකාබද්ධය හි දින ඒකාබද්ධ කරනු ලබන දින දක්වා පවතින අතර, එම පාලනය අවසන් වන හෙවත් නතර වන දිනය දක්වා ඒකාබද්ධව පවතිනු ඇත. පරිපාලිත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ස්ථිරසාර ගිණුම් ප්‍රතිපත්ති භාවිතා කරනු ලබන අතර එකී වාර්තා මව් සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන කාලපරිච්ඡේදයටම පිළියෙළ කරනු ලැබේ.

සමූහයේ සමාගම් අතර ගණුදෙනු යථාවත් නොකළ ලැබීම් හෙවත් ලාභ හා අලාභ නොසලකා ඇත. අන්තර් සාමූහික වත්කම් විකුණුම් මත වන යථාවත් නොකළ අලාභ, ඒකාබද්ධකරණයේදී ප්‍රතිවර්ත්‍ය කරනු ලැබ එහි යටින් දිවෙන හා පවතින වත්කම්ද හානිවීම සඳහා පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සමූහය විසින් උපුටා ගනු ලබන ගිනුම් ප්‍රතිපත්ති, සමග තිරසාර ගැලපීම තහවුරු කෙරෙන වස්, අවශ්‍ය අවස්ථාවන්හිදී ගැලපීමට හා සිරුමාරු කරනු ලැබීම කෙරිනි. එම සංඛ්‍යාවන් ගිනුම්ගත ප්‍රමාණය වාර්තාකරණු ඇත.

## 4. වැදගත් සංස්ථාගත ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය

### 4.1 විදේශ මුදල් වර්ග පරිවර්තනය කිරීම

මූල්‍ය ප්‍රකාශන. ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරන ලබනු අතර, ඒවා සමූහයේ කාර්යමය, ශ්‍රිතමය, ක්‍රියාකාරිත්වයේ හා ඉදිරිපත් කරලීමේ මුදල් වර්ගය වනු ඇත. විදේශ මුදල් වර්ගයන්හි ගනුදෙනු එකී ගනුදෙනුවල සටහන් දිනයට ක්‍රියාත්මක ව පවතින ක්‍රියාකාරි මුදල් වර්ග වල අනුපාතයන්හි නියමයට අනුගතව සිදුවනු ඇත. මූල්‍ය වත්කම් හා වගකීම් හෙවත් බැරකම් එනම් ශේෂපත්‍රයන්හි දිනයට විදහා දැක්වෙන හෙවත් ප්‍රදර්ශනය කරන ලද විනිමය මුදල් වර්ග, නැවතත් පරිවර්තනය කරගත හැකිය.

### 4.2 බදු

**වර්ථමාන බදු**

ප්‍රවර්තන බදු පවත්නා සහ පූර්ව කාලපරිච්ඡේද වලට අදාල ප්‍රවර්තන ආදායම් බදු වත්කම් සහ වගකීම්, නැවත අයකර ගැනීමට අපේක්ෂිත වටිනාකම් හෝ බදු අධිකාරින් හට ගෙවිය යුතු වටිනාකම් මත තක්සේරු කරනු ලැබේ. එම වටිනාකම් ගණනය කිරීමට යොදාගනු ලබන බදු, අනුපාත සහ බදු නියමයන් නීතිගත කර හෝ ශේෂ පත්‍ර දිනට සැළකිය යුතු ලෙස නීතිගත කරනු ලැබේ.

දේශීය ආදායම් පනතෙහි දක්වා ඇති විධිවිධාන අනුව ගණනය කොට මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කරන ලද ආදායම් සහ වියදම් අංගයන් පදනම් කරගෙන ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සිදු කර ඇත. වෙනත් විස්තරාත්මක ආදායමක් ලෙස හඳුනා ගත්, ආදායම් හෝ වියදම් අයිතමයකට අදාළ වෙනසක් සෘජුවම වෙනත් විස්තරාත්මක ආදායමක් ලෙස හඳුනා ගැනීමත් හැරුනු විට බදු ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනු ලැබේ.

**විලම්බිත බදු**

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා වත්කම් සහ වගකීම් වලට අදාලව බදු පදනම් සහ ඒවායෙහි පවත්නා අගය අතර පවතින තාවකාලික වෙනස්කම් මත වගකීම් විධික්‍රමය උපයෝගී කර ගනිමින් විලම්බිත ආදායම් බදු සඳහා ප්‍රතිපාදන සිදු කරනු ලැබේ.

විලම්බිත ආදායම් බදු වගකීම ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක මූලික හඳුනා ගැනීමකදී හටගනු ලබන විලම්බිත ආදායම් බදු සහ අදාල ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම් කරන ලාභයට හෝ බදු අය කළ හැකි ලාභ හෝ පාඩුවලට බලපෑමක් ඇති නොවන අවස්ථාවකදී හැරුණු විට සියලුම බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්හිත ආදායම් බදු වගකීම් හඳුනා ගනු ලැබේ.

අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වලට අදාල විලම්බිත ආදායම් බදු වත්කම් ව්‍යාපාර ඒකාබද්ධ කිරීමක් නොවන ගනුදෙනුවක වත්කමක් හෝ වගකීමක මූලික හඳුනා ගැනීමකදී සහ අදාළ ගනුදෙනුව සිදුවන අවස්ථාවේදී ගිණුම් කරන ලාභයට හෝ බදු අය කළ හැකි ලාභ හෝ පාඩු වලට බලපෑමක් ඇති නොවන අවස්ථාවකදී හැරුණු විට සහ අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ප්‍රයෝජනයට නොගත් ඉදිරියට රැගෙන ආ බදු වත්කම් සහ ප්‍රයෝජනයට නොගත් බදු පාඩු උපයෝජනය කිරීම සඳහා බදු අය කළ හැකි ලාභ පවතින බවට සසම්භාවී වන විටකදී ඉදිරියට නොගත් බදු පාඩු වලට අදාල සියලුම අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා විලම්හිත බදු වත්කම් හඳුනාගනු ලැබේ.

විලම්හිත බදු වත්කම් පූර්ණ හෝ අර්ධ වශයෙන් උපයෝජන කිරීම සඳහා ප්‍රමාණවත් බදු අය කළ හැකි ලාභ නොපවතින බවට තවදුරටත් සසම්භාවී වන විටදී වාර්තාකරනු ලබන සෑම වර්ෂයක් තුලදීම විලම්බිත ආදායම් බදු වත්කම් වල පවත්නා අගය විමර්ශනය කරනු ලැබේ.

විලම්බිත බදු වත්කම් ආපසු ලබා ගැනීම සඳහා අනාගත බදු අයකළ හැකි ලාභ පතින බව සසම්භාවී වන විටදී හඳුනා නොගත් විලම්බිත බදු වත්කම් වල පවත්නා අගය සෑම වර්ෂයකම වාර්තා කරනු ලබන දිනයේදී නැවත තක්සේරු කරනු ලබයි.

අදාල වත්කම විකුණා ලබන වර්ෂයට අදාල අපේක්ෂිත අනුපාතිකය හෝ අදාල වගකීම පියවීමට අපේක්ෂිත අනුපාතිකය වාර්තා කරනු ලබන දිනට ප්‍රඥප්ති හෝ සැලකිල්ලට ගනු ලබන බදු අනුපාතික සහ බදු නීති යනාදිය මත විලම්බිත ආදායම් බදු වත්කම් සහ වගකීම් මිනුම් කරන ලදී.

හිමිකරු කොටස් ප්‍රාග්ධනය තුල සෘජුව ම හඳුනා ගනු ලැබූ අයිතම වලට අදාළ විලම්හිත ආදායම් බදු ආදායම් ප්‍රකාශයනය තුල නොව, හිමිකරු කොටස් ප්‍රාග්ධනය තුල හඳුනා ගෙන ඇත.

### 4.3 ණය ගැනීමේ පිරිවැය

අපේක්ෂිත පරිහරණය තෙත් සුදානම් කිරීම සඳහා හෝ විකිණීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගත වන වත්කමක් සඳහා අදාළ මිලදී ගැනීමේදී ඉදි කිරීමේදී හෝ නිෂ්පාදනය කිරීමේදී සෘජුවම ආරෝපණය කළ හැකි ණය ගැනීමේ පිරිවැය අදාල වත්කමෙහි පිරිවැයට අයත් කොටසක් ලෙස ප්‍රාග්ධනිත කරනු ලැබේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය එම පිරිවැය දරනු ලබන කාලසීමාවට අදාල වියදමක් ලෙස සලකනු ලබන මුදල් ණයට ගැනීමට අදාලව දරනු ලබන පොලී සහ වෙනත් වියදම් ණය ගැනීමේ පිරිවැය තුල අන්තර්ගත වේ.

### 4.4 තොග

යල්පැනගිය සහ මන්දගාමී ලෙස චලනය වන අයිතම සඳහා ඉඩ හැරීමෙන් පසුව පවතින පිරිවැයෙහි හෝ ශුද්ධ විකුණුම් අගයෙහි අවම අගය මත තොග තක්සේරු කරනු ලැබේ. ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ පිරිවැය සහ විකිණීම සඳහා අනිවාර්යයෙන් දැරිය යුතු පිරිවැය ඉවත් කිරීමෙන් පසුව පවතින අගයට සාමාන්‍ය ව්‍යාපාර චාර්යාව තුලදී තොග විකිණීමට හැකිවේ. පිරිවැය තීරණය කිරීම ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත් කිරීම් ක්‍රමය මත සිදුවේ.තොග අගය අඩුවීමේ හානි අප්‍රමාදව ලාභ අලාභ ගිනුමෙහි හඳුනා ගනු ලැබේ.

### 4.5 මුදල් හා මුදල් සමාන දෑ

අතැති මුදල්, ඉල්ලුම් තැනපතු සහ කෙටිකාලින අධි ද්‍රවශීලි ආයෝජන, වටිනාකම වෙනස්වීමේ ඉතා අල්ප අවදානමක් සහිත ගම්‍ය වූ මුදල් වටිනාකම් වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි දෑ මුදල් සහ මුදල් සමන දෑ ලෙස හැඳින්විය හැකිය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා මුදල් සමාන දෑ තුල අතැති මුදල් සහ හිගව පවතින බැංකු අයිරා අඩු කිරීමෙන් පසුව ඉතිරි වන බැංකු තැන්පතු අන්තර්ගත වේ. මිලදී ගනු ලැබූ දිනයේ සිට මාස 3 ක් හෝ ඊට අඩු කෙටි කල් පිරීමේ කාලයක් සහිත ආයෝජනද මුදල් සමාන දෑ ලෙස සැලකේ.

## 4.6 දේපල යන්ත්‍ර හා උපකරණ

**පිරිවැය**

එදිනෙදා නඩත්තු සේවා පිරිවැය, සමුච්චිත ක්ෂය වීම් සහ සමුච්චිත අගය අඩුවීමේ අගය අඩු කිරීමෙන් පසුව පවතින පිරිවැය අගයට දේපළ, යන්ත්‍ර හා උපකරණ පවත්නා ගෙන යනු ලැබේ. හඳුනාගැනීමේ උපමානයන් සම්පූර්ණ වන්නේ නම් එවැනි පිරිවැය තුල අදාල පිරිවැය දරන අවස්ථාවේදී යන්ත්‍ර සහ උපකරණ වල කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය ඇතුලත් වේ.

**ක්ෂය වීම**

ඇස්තමේන්තුගත ඵලදායි ජීව කාලය මුළුල්ලෙහි වත්කම් වල පිරිවැය, එම වත්කම් වල ශුද්ධ අගය අඩු කිරීමෙන් පසුව පවතින අගය බෙදා හැරීම සඳහා සරළ මාර්ග ක්‍රමය මත ක්ෂය අය කිරීම සිදු කරනු ලබයි. දේපල, යන්ත්‍ර හා උපකරණ ක්ෂය කිරීම සඳහා පහත සඳහන් වාර්ෂික අනුපාත උපයෝගි කරගනු ලැබේ.

| | |
|---|---|
| ගොඩනැගිලි - පැරණි | අවුරුදු 25 |
| ගොඩනැගිලි - නව | අවුරුදු 20 |
| යන්ත්‍ර හා උපකරණ | අවුරුදු 08 |
| මෝටර් රථ | අවුරුදු 04 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | අවුරුදු 08 |
| පරිගණක හා උපාංග | අවුරුදු 04 |
| වායු සමීකරණ | අවුරුදු 04 |

කිසියම් වත්කමක් ක්ෂය කිරීම එම වත්කම ප්‍රයෝජනය සඳහා භාවිතා කරන විට ආරම්භ වන අතර අදාල වත්කම හඳුනාගැනීමක් නොවන අවස්ථාවේදී ක්ෂය කිරීම අවසන් වේ. ක්ෂය අනුපාතියෙහි, ඵලදායි ජීව කාලයෙහි හෝ වත්කමෙහි ශුද්ධ අගයෙහි සැළකිය යුතු වෙනසක් පවතින බවට හැඟවීමක් තිබෙන විට නව අපෙක්ෂාවන් දැක්වීම සඳහා අදාල වත්කමෙහි ක්ෂය පෙර දක්නා ලෙස ප්‍රතිශෝධනය කරනු ලැබේ.

**ප්‍රාග්ධනයට අදාල නොනිම් වැඩ**

ප්‍රාග්ධනයට අදාල නොනිම් වැඩ පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් දිගු කාලීන ප්‍රාග්ධන ව්‍යාපෘති වල සෘජුවම ඇතුලත් ඉදිකිරීම් කටයුතු වලට අදාල වියදම් වේ. ව්‍යාපෘති අවසන් වී අදාල වත්කම් ප්‍රයෝජනයට සුදුසු වන තෙක් දරනු ලබන ප්‍රාග්ධන ගණයට අයත් වියදම් ප්‍රාග්ධනයට අදාල නොනිම් වැඩ ලෙස හිනුම් ගත වේ.

**හඳුනාගැනීමෙන් ඉවත් කිරීම**

ආරම්භයේදී හදුනාගත් දේපල යන්ත්‍ර හා උපකරණ වලට අදාල කිසියම් අයිතමයක් විකිණීමේදී හෝ එම වත්කම භාවිතයේදී හෝ විකිණීමේදී අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොමැති අවස්ථාවකදී එම වත්කම හදුනාගැනීමෙන් ඉවත් කරනු ලැබේ. එවැනි හඳුනාගැනීමෙන් ඉවත් කිරීමකදී හටගනු ලබන කිසියම් ලාභයක් හෝ පාඩුවක් (වත්කමෙහි පවත්නා අගය සහ ශුද්ධ විකුණුම් ආදායම් අතර වෙනස) අදාල වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කිරීමේදී ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කරනු ලැබේ.

**ආයෝජන වත්කම් සඳහා නැවත වර්ග කිරීම**

කිසියම් වත්කමක භාවිතය අයිතිකරු සතුව තිබි ආයෝජන වත්කමක් ලෙස පරිවර්තනය වන අවස්ථාවකදී අදාල වත්කම ආයෝජන වත්කම් ලෙස නැවත වර්ග කර පිරිවැය අගයට දක්වනු ලැබේ.

## 4.7 ආයෝජන වත්කම්

කුලී ආදායම් ඉපයීම හෝ ප්‍රාග්ධන ඇගයීම හෝ මෙම කරුණු දෙකම සඳහා රඳවා ගනු ලබන වත්කම් ආයෝජන වත්කම් වන අතර මෙම වත්කම් සාමාන්‍ය ව්‍යාපාර චර්යාව තුල විකිණීම සඳහා නිෂ්පාදන කටයුතු සඳහා යොදාගැනීමට හෝ පරිපාලන කටයුතු සඳහා භාණ්ඩ හා සේවා සැපයීම සඳහා යොදා ගනු නොලැබේ.

සමුච්චිත ක්ෂය සහ සමුච්චිත අගය අඩුවීම් අඩු කිරීමෙන් පසුව පවතින පිරිවැයට ආයෝජන වත්කම් තක්සේරු කරනු ලැබේ. ආයෝජන වත්කම් මිලදී ගැනීම සඳහා සෘජුවම ආරෝපණ කල හැකි වියදම් මෙම පිරිවැය තුල අන්තර්ගත වේ. ස්වයංව ගෙඩනංවන ලද ආයෝජන වත්කම් වල පිරිවැය තුල අදාල ආයෝජන වත්කම් එම වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජනය සඳහා යොදාගත හැකි තත්ත්වයට පත් කිරීමට සෘජුවම ආරෝපනය කල හැකි වෙනත් වියදම් ද්‍රව්‍ය පිරිවැය සහ ශ්‍රම පිරිවැය යනාදිය ඇතුලත් වන අතර ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලැබේ.

කිසියම් ආයෝජන වත්කමක් විකිණීමේදී ස්ථිර ලෙස භාවිතයෙන් ඉවත් කරන අවස්ථාවකදී සහ අදාල වත්කම විකිණීමෙන් කිසිදු අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති අවස්ථාවකදී අදාල ආයෝජන වත්කම් හඳුනාගැනීමෙන් ඉවත් කෙරේ. අදාල වත්කමේ පවත්නා අගය සහ ශුද්ධ විකුණුම් ආදායම් අතර වෙනස (ආදාල වත්කම හඳුනාගැනීමෙන් ඉවත් කරන ලද කාලපරිච්ඡේදයට අයත්) ලාභ අලාභ ප්‍රකාශනයෙහි හදුනා ගනු ලැබේ.

ආයෝජන වත්කම් වලට සිදු කරනු ලබන මාරු කිරීම් හෝ ආයෝජන වත්කම් වලින් සිදු කරනු ලබන මාරු කිරීම් අදාල වත්කම භාවිතයේ ඇති වන වෙනසකදී පමණක් සිදු කරනු ලබේ. ආයෝජන වත්කම් සහ අයිතිකරු සතුව පැවති වත්කම් අතර සිදු වන හුවමාරු මගින් අයිතිකරු සතුව පැවති වත්කම් වලින් ආයෝජන වත්කම් ලෙස පරිවර්තනය වීමේදි පවත්නා අගය නෙවෙනස්ව පසුව එළැඹෙන ගිනුම්කරණ අවශ්‍යතා සඳහා දරනු ලබන පිරිවැයක් ලෙස සැලකේ.

## 4.8 කල්බදු වත්කම්

සමූහ ව්‍යාපාරයට කල්බදු වත්කම්වල හිමිකමේ සියලුම අවදානම් ප්‍රදානයන් සත්‍ය ලෙස පවරන්නේ නම් කල්බද්දක් මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කළ හැකිය. අදාළ වත්කම් කල්බදු වත්කමේ සාධාරණ වටිනාකමට හෝ කල් බදු ගෙවීමේ වර්තමාන වටිනාකමට අඩුනම් අමතර පිරිවැයත් සමග ආරම්භයේ දී හඳුනාගනී. ලේඛනගත වටිනාකම මූල්‍යමය කල්බදු ගෙවීම වගකීම වශයෙන් හඳුනාගනී. සමූහ ව්‍යාපාරයට නීත්‍යානුකූලව අයත් වූ සැසඳිය හැකි වත්කම් මූල්‍ය කල්බදු ගිවිසුම් වල පවතින වත්කම් සඳහා වූ ක්ෂය කිරීමේ ක්‍රම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලයන්ට සමානරූපී වේ. අනුරූප මූල්‍ය කල්බදු වගකීම වැය වූ මූල්‍යමය පිරිවැයේ කොටසක් වූ ණය පොලී මුදල් අඩුකළ කල්බදු ගෙවීම් මගින් අඩු වේ. කල්බදු ගෙවීමේ පොලිය නොපිය වූ ප්‍රාග්ධන ශේෂයන්ගෙන් අඛණ්ඩව සමානුපාතිකව ඵලදායි පොලී ක්‍රමය ප්‍රයෝජනයට ගනිමින් ගණනය කර වියදමක් ලෙස කල්බද්ද පවතින කාලය මුළුල්ලේ ලාභාලාභ ගිණුමට ඇතුල් කරයි. අනෙකුත් සියලුම කල්බදු මෙහෙයුම් කල්බදු වශයෙන් සලකනු ලැබේ. මෙහෙයුම් කල්බදු මත ගෙවන ගෙවීම් කල්බදු කොන්දේසි මත සරල මාර්ග ක්‍රමය පාදක කරගත් වියදමක් වශයෙන් හඳුන්වා ඇත. නඩත්තු සහ රක්ෂණය වැනි ආශ්‍රිත පිරිවැය ඒවා හටගන්නා විට වියදමක් ලෙස සලකයි.

## 4.9 අස්පෘශ්‍ය වත්කම්

වෙන් වෙන් වශයෙන් අත්පත් කර ගන්නා ලද අස්පෘෂය වත්කම් ආරම්භක හදුනාගැනීමේදී පිරිවැය අගයට මනිනු ලැබේ. ආරම්භක හදුනාගැනීමෙන් පසුව අස්පෘෂ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත අඩුවීම අඩු කිරීමෙන් පසුව ලැබෙන අගයට පවත්වා ගෙන යනු ලැබේ.

ප්‍රාග්ධනිත සංවර්ධන වියදම් බැහැර කරන ලද අභ්‍යන්තරයෙන් ජනනය වූ අස්පෘෂ්‍ය වත්කම් ප්‍රාග්ධනිත කරනු නොලබන අතර එම වියදම දරනු ලබන වර්ෂයට අදාල ආදායම් ප්‍රකාශයතුල දක්වනු ලැබේ.

නියමිත ජීවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් ඵලදායි ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කරනු ලබන අතර කිසියම් අවස්ථාවකදී අස්පෘෂ්‍ය වත්කම්වල අගය අඩු වන බව පෙන්නුම් කරනු ලැබුවහොත් අඩුවීම වෙනුවෙන් අස්පෘෂ්‍ය වත්කම් තක්සේරු කරනු ලබයි. නියත ජීවිත කාලයක් සහිත එම අස්පෘෂ්‍ය වත්කම් සඳහා වන ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය සහ ක්‍රමක්ෂය ක්‍රමය අවම වශයෙන් අදාල මූල්‍ය කාලපරිච්ඡේදය අවසානයේදී ලැබේ. වත්කම් තුල දක්වනු ලබන අපේක්ෂිත ඵලදායි ජීවිත කාලය හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා කරන ආකාරයෙහි ඇති වන වෙනස්වීම් අදාල පරිදි ක්‍රමක්ෂය කාලපරිච්ඡේදය හෝ ක්‍රමය වෙනස් කිරීම මගින් ගිණුම්ගත කරනු ලබන අතර ගිණුම්කරණ ඇස්තමේන්තු වල ඇති වන වෙනස්වීම් ලෙස සළකනු ලබයි. නියත ජීවිත කාලයක් සහිත අස්පෘෂ්‍ය වත්කම් වලට අදාල ක්‍රමක්ෂය වියදම් ආදායම් ප්‍රකාශයෙහි අස්පෘෂ්‍ය වත්කම් වල කාර්යභාරයට අනුකූල වන පරිදි වියදම් වර්ගය යටතේ හඳුනාගනු ලබයි.

### පරිගණක මෘදුකාංග

මිලදී ගනු ලැබූ හෝ වැඩිදියුණු කරන ලද දිනයේ සිට වර්ෂ 4 ක් තුලදී පරිගණක මෘදුකාංග ක්‍රමක්ෂය කරනු ලබයි.

## 4.10 මූල්‍ය උපකරණ - මූලික එකඟතාව හා ඇතිවන මිම්ම

### 4.10.1 මූල්‍ය වත්කම්

වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ සහ මුදල් සහ මුදලට සමාන දෑ

මෙම මූල්‍ය වත්කම් හුවමාරු මිලේදී මූලිකව හඳුනා ගැනේ. පසුව මේවා ක්‍රමක්ෂය පිරිවැයේ දී ඵළදායි පොලී ක්‍රමය අනුගමනය කරමින් හානිය සඳහා වෙන්කිරීමක් අඩුකරමින් මනිනු ලබයි. විකුණුම් සාමාන්‍ය ණය කොන්දේසි අනුව කරන අතර වෙළඳ ණයගැතියන්ගෙන් පොලියක් අය නොකරයි. ලැබිය යුතු වටිනාකම් අයකරගත නොහැකි බවට සාක්ෂි ඇතිවිට හානියේ පාඩුව ලාභාලාභ ගිණුමෙන් හඳුනාගත හැක. වසරකට වැඩි කාලයක් හිඟව පවතින අයවීම් සඳහා සම්පූර්ණයෙන් ප්‍රතිපාදන වෙන්කර ඇත.

**දිගුකාලීන මූල්‍ය වත්කම්**

දිගුකාලීන මූල්‍ය වත්කම් සෑදී තිබෙන්නේ සාමාන්‍ය කොටස් සුරැකුම් පත්වල ආයෝජනය කිරීමෙනි. ඒවා හුවමාරු මිලේදී මූලිකව හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් පසුව මහජනයා අතර විකිණෙන හෝ සාධාරණ වෙළඳ වටිනාකම විශ්වාසනීය ලෙස මනිනු ලබන සාමාන්‍ය කොටස් වල ආයෝජනයන් ලාභාලාභයේ දී හඳුනාගත් සාධාරණ වෙළඳ වටිනාකමින් සාධාරණ වෙළඳ වටිනාකමේ වෙනස්වීම් මනිනු ලැබේ. අනෙකුත් සාමාන්‍ය කොටස්වල ආයෝජනයන් ඕනෑම හානියක් අඩුකළ පිරිවැයට මනිනු ලැබේ.

**4.10.2 මූල්‍ය වගකීම්**

සමූහ ව්‍යාපාරයේ මූල්‍යමය වගකීම් වනුයේ ණය ගැනීම් සහ වෙළඳ සහ අනෙකුත් ගෙවීම් වේ. මූල්‍ය වගකීම් මූලික වශයෙන් ගනුදෙනු කරන මිලේදී හඳුනාගැනේ. මූලික හඳුනාගැනීමෙන් අනතුරුව මේවා සඵල පොලී ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයේදී මනිනු ලැබේ. වෙළඳ ණය සාමාන්‍ය ණය කොන්දේසි මත ක්‍රියාත්මක වේ. පොලියක් ගෙවීමට සිදු නොවේ.

## 4.11 පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ, කෙටිකාලීන සේවක ප්‍රතිලාභ සහ සේවය අවසන් කිරීමේ ප්‍රතිලාභ
